ගිණුම්කරණය I
Accounting I

General Certificate of Education (Adv. Level)
Examination – Practice Question Paper - 2025
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
පෙරහුරු ප්‍රශ්න පත්‍රය 2025

පැය දෙකයි
Two hours

උපදෙස් :
a. **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
b. ප්‍රශ්න අංක **01** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියන්න.**
c. ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුර අදාළ **තිත් ඉර මත ලියන්න.**
d. සෑම ප්‍රශ්නයකටම **සමාන** ලකුණු හිමි වේ**.**
e. **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව ලියන්න.
f. **වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

1. පහත දැක්වෙන කුමන ප්‍රකාශය, ආයතනයක ගිණුම්කරණයේ මූලික පරමාර්ථය වඩාත් හොඳින් විස්තර කරනු ලබයි ද?
   1. ආයතනයකට අරමුදල් සපයන්නන් සඳහා පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම.
   2. මූල්‍ය කාලච්ඡේදයක් තුළ සිදු වූ ගනුදෙනු වාර්තා කිරීම.
   3. ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීමට අවශ්‍ය ආර්ථික තොරතුරු සැපයීම.
   4. ආයතනය පිළිබඳ විවිධ තීරණ ලබා ගැනීමට කළමනාකරුවන්ට අවශ්‍ය තොරතුරු ලබා දීම.
   5. ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ආයතනයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.

(.........)

2. ව්‍යාපාරයක තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් ක්‍රමයේ (FIFO) සිට හරිත සාමාන්‍ය මිල ක්‍රමයට (WAC) වෙනස් කිරීම සිදු වුයේ නම්, එවිට කඩ වූ ගිණුම්කරණ සංකල්පය වනුයේ ;
   1. ඓතිහාසික පිරිවැය
   2. අනාවරණ
   3. යථාරූපී
   4. සංගතතා
   5. අඛණ්ඩ පැවැත්ම

(.........)

3. ගිණුම්කරණ සංකල්ප භාවිතය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?

   A. පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොගය හඳුනා ගැනීම ආරක්ෂණ සංකල්පයට අදාළ යි.

   B. යථාරූපී සංකල්පයට අනුව ආයතනයක සම්මුතික බැඳීමක් එහි වගකීමක් ලෙස හඳුනා ගනියි.

   C. ණයගැතියන් හා ණයහිමියන් හඳුනා ගැනීමට පදනම සපයනු ලබන්නේ, උපලබ්ධි සංකල්පයයි.

   1. A පමණි 2. B පමණි 3. A හා B පමණි
   4. A හා C පමණි 5. B හා C පමණි

(.........)

- ප්‍රශ්න අංක 4 - 7 දක්වා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

2025-01-01 දින මනුජ රු. 1 000 000ක් ප්‍රාග්ධනය ලෙස යොදා ලී බඩු අලෙවි වෙළෙඳසලක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි ආයතනයකි. 2025 ජනවාරි මාසය තුළ පහත ගනුදෙනු සිදු වී ඇත.

අංකය	ගනුදෙනුව
1	ලකුණු කළ මිල රු. 500 000ක් වූ ලී බඩු 10%ක වෙළඳ වට්ටමක් අඩු කළ පසුව ණයට මිලදී ගැනීම (මෙහිදි 18% ක VAT අදාළ විය යුතුයි.)
2	පිරිවැය 120 000ක් වූ ලී බඩු රු. 177 000 ක් අත්පිට විකිණීම. (මෙහි රු. 27 000ක් VAT අඩංගු ය)
3	රු. 200 000 ක් පිරිවැය වූ ලී බඩු 295 000 ක් සිදත්ට ණයට විකිණීම.
4	(මෙහි රු. 45 000ක් VAT අඩංගු ය)
5	සිදත්ට ණයට විකුණූ භාණ්ඩවලින් හරි අඩක් (50%) දෝෂ සහිත වූ බැවින් ආපසු එවීම.

4. ඉහත ගනුදෙනු අංක අනුපිළිවෙළින් පොත්වල සටහන් කිරීමේ දී යොදා ගන්නා මූලික සටහන් පොත් වනුයේ;
   1. මුදල් ගෙවීම් ජ'නලය , මුදල් ලැබීම් ජ'නලය, විකුණුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය
   2. ගැනුම් ජ'නලය, මුදල් ලැබිම් ජ'නලය, ගැනුම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය
   3. ගැනුම් ජ'නලය, මුදල් ලැබිම් ජ'නලය, විකුණුම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය
   4. ගැනුම් ජ'නලය, පොදු ජ'නලය, විකුණුම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය
   5. පොදු ජ'නලය, විකුණුම් ජ'නලය, විකුණුම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය

(.........)

5. ගනුදෙනු අංක 1,2 හා 3 හි ශුද්ධ බලපෑම පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්නුම් කරනු ලබයි ද?

	වත්කම් (රු. 000)	=	හිමිකම් (රු. 000)	+	වගකීම් (රු.000)
1	635.8		55		580.5
2	635.8		80		558.8
3	683		161		522
4	683		80		603
5	742		80		662

(.........)

6. ගනුදෙනු අංක 1 ලෙජරයට පිටපත් කිරීම සඳහා නිවැරදි ද්විත්ව සටහන වන්නේ;

	විස්තරය	හර (රු. 000)	බැර (රු. 000)
1	ගැනුම් ගිණුම	450	
	VAT පාලන ගිණුම	81	
	ණය හිමි පාලන ගිණුම		531
2	ගැනුම් ගිණුම	531	
	ණය හිමි පාලන ගිණුම		531
3	ගැනුම් ගිණුම	500	
	VAT පාලන ගිණුම	81	
	ණය හිමි පාලන ගිණුම		581

4	ණය හිමි පාලන ගිණුම	450	
	VAT පාලන ගිණුම	81	
	ගැනුම් ගිණුම		531
5	ගැනුම් ගිණුම	450	
	VAT පාලන ගිණුම	81	
	මුදල් පාලන ගිණුම		581

(.........)

7. මනුජගේ ව්‍යාපාරයේ 2025.01.31 දිනට VAT පාලන ගිණුමේ ශේෂය සහ ශුද්ධ ලාභයෙහි වැඩිවීම නිවැරදිව දැක්වෙන පිළිතුර වනුයේ,

	VAT පාලන ගිණුමේ ශේෂය (රු.000)	ශුද්ධ ලාභය (රු.000)
1	0.9 හර	80
2	13.5 බැර	80
3	13.5 බැර	25
4	31.5 හර	80
5	31.5 හර	55

(.........)

8. අකිත්ගේ ව්‍යාපාරයේ 2025 03.31 න් අවසන් වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසුව පහත වැරදි හෙළිදරව් විය.

- මුදල් ලැබීම් ජ'නලයේ දුන් වට්ටම් තීරුවේ එකතුව ලෙජරයට පිටපත් කිරීමේදී 360 000 වටිනාකම 630 000 ක් ලෙස සටහන් වීම.
- රු. 85 000 විකුණුම් ඉන්වොයිසියක් පොත්වලින් මඟ හැරීම.
- 2025.03.31 න් අවසන් වර්ෂයට අදාළ වරිපනම් ගාස්තුව රු.108 000 ක් වුව ද මෙම වටිනාකමින් ගෙවූ 50% ක් පමණක් වරිපනම් ගිණුමේ සටහන් කිරීම.

ඉහත වැරදි නිවැරදි කල පසු ව්‍යාපාරයේ ශුද්ධ ලාභයෙහි වැඩිවීම වනුයේ (රු. 000 වලිනි) ;

(1) 131 (2) 239 (3) 247 (4) 301 (5) 391

(.........)

9. සුචිමාලි ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යන තනි පුද්ගල ව්‍යවසායිකාවකි. ඇයගේ ව්‍යාපාරයේ ඇඟළුම් සේවිකාවන් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) 10% කින් දායක වන අතර, ආයතනය 15% කින් දායක වේ. සේවා නියුක්ත භාර අරමුදලට (ETF) සඳහා දායකත්වය 3% කි. ව්‍යාපාරය EPF හා ETF අදාළ අරමුදල් වෙත ගෙවනුයේ ඊළඟ මාසයේ 10 වෙනි දින ය.

2025.03.31 න් අවසන් මාසය සඳහා ව්‍යාපාරය ගෙවූ ශුද්ධ වැටුප 2 650 000 ක් විය.මෙම ශුද්ධ වැටුප ගණනය කිරීමේදී සුබ සාධක අරමුදලට 50 000ක් සහ අර්ථ සාධක අරමුදල් දායකය අඩු කරගෙන ඇත. 2025.03.31 න් අවසන් මාසය සඳහා සේවකයින්ට අදාළ මුළු වියදම හා ගෙවිය යුතු EPF වගකීම කොපමණ ද?

	මුළු වියදම(රු.000)	ගෙවිය යුතු EPF වටිනාකම
1.	2 700	750
2.	3 180	780
3.	3 450	450
4.	3 540	750
5.	3 590	300

(.........)

10. දේවක නිසි පරිදි ගිණුම් වාර්තා පවත්වා නොගනිමින් වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. පහත තොරතුරු 2025.03.31 න් අවසන් වර්ෂය සඳහා ඔබට ලබා දී ඇත.

	රු.000 වලින්
2024.04.01 දිනට තොග	250
විකුණුම්	2 600
ආපසු යැවුම්	60
ගෙන ඒමේ කුලී	50
2025.03.31 දිනට තොග	160

මෙම ආයතනය පිරිවැය මත 25% ක ලාභ ආන්තිකයක් සහිතව භාණ්ඩ අලෙවි කරනු ලබයි.
2025.03.31 න් අවසන් වර්ෂය සඳහා ගැනුම් වටිනාකම කොපමණ ද? (රු. 000)

(1) 1 750 (2) 1 870 (3) 1 950 (4) 2 000 (5) 2 100

(.........)

11. 2025.03.31 න් අවසන් වර්ෂය සඳහා සනුකගේ නිෂ්පාදන ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

	රු.000
අමුද්‍රව්‍ය තොගයේ වැඩි වීම	200
අමු ද්‍රව්‍ය ගැනුම්	1 500
අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී	100
නොනිමි තොගයේ අඩු වීම	20
සෘජු ශ්‍රම පිරිවැය	400
සෘජු වෙනත් පිරිවැය	200
නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය	1 180

- මුළු නිෂ්පාදන පිරිවැය මත පදනම්ව නොනිමි තොගය අගය කරයි.

2025.03.31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රාථමික පිරිවැය සහ මුළු නිෂ්පාදන පිරිවැය වන්නේ;

	ප්‍රාථමික පිරිවැය (රු.'000)	මුළු නිෂ්පාදන පිරිවැය (රු.'000)
(1)	1 800	3 200
(2)	2 000	3 200
(3)	2 000	3 160
(4)	2 400	3 600
(5)	2 400	3 560

(.........)

12. අදීෂගේ ව්‍යාපාරයේ 2025.03.31 දිනට පිළියෙල කල ශේෂ පිරික්සුම අසමාන වූයෙන් වෙනස අවිනිශ්චිත ගිණුමක සටහන් කරන ලදි. ඒ අනුව ගණනය කරන ලද කෙටුම්පත් ශුද්ධ ලාභය 275 000 ක් විය. පසුව කරන ලද ගිණුම් පරීක්ෂාවේ දී පහත කරුණු හෙළිදරව් විය.

1) රු. 20 000 ක හරපතක් පොත්වලින් මග හැරී ඇත.
2) රු. 25 000 ක විදුලි බිල ගෙවීම මුදල් ගිණුමට නිවැරදිව සටහන් කර විදුලි ගාස්තු ගිණුමට 20 500 ක් ලෙස සටහන් වී ඇත.
3) ණය ගැතියන්ගෙන් ලද රු. 15 000 ක් මුදල් ගිණුමට පමණක් සටහන් වී ඇත.
4) රු. 10 000 වරිපනම් ගාස්තු ගෙවීම අදාළ ගිණුම් දෙකෙහිම හරට සටහන් වී ඇත.

2025.03.31 න් අවසන් වර්ෂයේ නිවැරදි ශුද්ධ ලාභය හා වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය වනුයේ;

	නිවැරදි ශුද්ධ ලාභය (රු000)	අවිනිශ්චිත ගිණුමේ ශේෂය (රු.000)
(1)	279.5	39.5 (බැර)
(2)	280.5	30.5 (හර)
(3)	280.5	20.5 (බැර)
(4)	290.5	50.5 (හර)
(5)	290.5	30.5 (බැර)

(.........)

13. 'තිසර' ක්‍රීඩා සමාජය 2023.01.01 දින ආරම්භ කල අතර, එදින 25 000 බැගින් යාවජීව සාමාජික මුදලක් ගෙවමින් සාමාජිකයින් 20 ක් බැඳුනු අතර, වාර්ෂිකව රු. 1 200 ක් ගෙවන සාමාජිකයන් 100 ක් සාමාජිකත්වය ලබා ගන්නා ලදි.

- යාවජීව සාමාජික මුදල වර්ෂ 10 ක් තුළ ආදායමෙහි හඳුනාගත යුතුයි.
- 2023.12.31 දින තවත් සාමාජිකයින් 10 ක් සමිතියට බැඳුණු අතර ආරම්භක සාමාජිකයින්ගෙන් 20 ක් එදින ඉවත් විය.

සාමාජික මුදල්	2024.01.01 දිනට	2024.12.31 දිනට
හිඟ සාමාජික මුදල	12 000	24 000
කලින් ලද සාමාජික මුදල්	18 000	36 000

ඉහත තොරතුරු අනුව, 2024.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ මුළු සාමාජික මුදල් ආදායම හා මුදලින් ලද සාමාජික මුදල් වනුයේ ;

	මුළු සාමාජික මුදල් ආදායම (රු.000)	මුදලින් ලද සාමාජික මුදල (රු.000)
(1)	108	138
(2)	158	114
(3)	500	500
(4)	608	156
(5)	658	614

(.........)

14. 1890 හවුල් ආඥාපනතෙහි 24 වන වගන්තියට අනුව නිවැරදි ප්‍රකාශ අඩංගු පිළිතුර වන්නේ;

A - හවුල් ව්‍යාපාරයේ ලාභාලාභ යෙදූ ප්‍රාග්ධනයේ අනුපාතයට අනුව බෙදා ගත යුතු ය.

B - ප්‍රාග්ධනයට අමතරව ලබා දුන් ණය සඳහා 5%ක පොලියක් ලබා දිය යුතු ය.

C - කළමනාකරණයට දායක වන හවුල්කරුවන්ට හවුල් වේතන ලබා ගත නොහැක.

D - හවුල් ව්‍යාපාරයේ වියදමක් හවුල්කරුවෙකු තම පෞද්ගලික මුදලින් ගෙවීම, ගිණුම්ගත කිරීම අවශ්‍ය නොවේ.

(1) A හා B පමණි.

(2) B හා C පමණි.

(3) B හා D පමණි.

(4) A,B හා C පමණි.

(5) C, B හා D පමණි.

(.........)

- අංක 15 සහ 16 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

  තිසාගි හා මෙතුලි විසින් පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයෙහි හවුල් ගිවිසුම පහත පරිදි ය.

1. තිසාගි හා මෙතුලි අතර ලාභාලාභ බෙදා ගැනීමේ අනුපාතය 3:2 වේ.
2. සියලුම හවුල්කරුවන්ට මාසිකව රු.20 000 බැගින් හවුල් වේතන හිමි වේ.
3. ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත 5% ක වාර්ෂික පොලියක් හිමි වේ.

2024.04.01 දිනට හිමිකම පහත පරිදි ය.

	තිසාගි	මෙතුලි
ජංගම ගිණුම (රු.000)	200	(100)
මුළු හිමිකම (රු.000)	3 200	1900

- වර්ෂය තුළ තිසාගි රු. 250 000ක් මුදල් ගැනීම් කර ඇති අතර, මෙතුලි රු. 300 000ක වෙළඳ භාණ්ඩ සිය පෞද්ගලික ප්‍රයෝජනයට ලබා ගෙන ඇත. මේ සම්බන්ධව පොත්වල කිසිවක් සටහන් කර නැත.
- තිසාගි ප්‍රාග්ධනයට අමතරව 2024.07.01 දින රු. 400 000ක ණය මුදලක් හවුල් ව්‍යාපාරයට සපයා ඇත. මේ සඳහා පොළී ගලපා හෝ ගෙවා නොමැත.
- 2025.03.31 දින සව්රු ප්‍රාග්ධනයෙන් 1/6 ක කොටසක් ලබා ගැනීමේ පොරොන්දුව මත හවුල් ව්‍යාපාරයට 2 500 000ක් ප්‍රාග්ධනය ලෙස යොදවමින් සම්බන්ධ විය. එදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 300 000කට තක්සේරු කර ප්‍රාග්ධන ගිණුම මගින් ගලපන ලදි.
- 2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 1 045 000 කි.

15. 2025.03.31 දිනට තිසාගිගේ ජංගම ගිණුමේ ශේෂය වනුයේ ;(රු.000 වලිනි)
    (1) 700 (2) 715 (3) 722 (4) 725 (5) 1 100

(.........)

16. 2025.03.31 දිනට මෙතුලිගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය වනුයේ (රු.000 වලිනි)
    (1) 1 900 (2) 1 920 (3) 2 000 (4) 2 020 (5) 2 050

(.........)

17. LKAS 01 - ''මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතියට'' අනුව පහත කුමන ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වෙනසක් මූල්‍ය වර්ෂය තුළ සිදුවී ඇතිවිට පමණක් හිමිකම වෙනස්වීමේ ප්‍රකාශනය පිළියෙළ කළ යුතු ය.
(B) මූල්‍ය වර්ෂයේ වාර්තා කර ඇති සෑම අයිතමයකටම අදාළව අවම වශයෙන් පසුගිය වර්ෂයක් සඳහාවත් සංසන්දනාත්මක තොරතුරු (Comparative information) ඉදිරිපත් කල යුතු ය.
(C) ආයතයක් විසින් එහි සියලු මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමට පිළයෙළ කළ යුතු ය.

(1). A පමණි

(2). B පමණි

(3). C පමණි

(4). A හා C පමණි

(5). B හා C පමණි

(.........)

18. ලී බඩු නිෂ්පාදනය කරන සමාගමක් 2005 මාර්තු මාසයේ ලද ඇනවුමක් වෙනුවෙන් නිෂ්පාදනය කරන ලද පොත් රාක්ක 100කට අදාළ නිෂ්පාදන පිරිවැය සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

විස්තරය	**රු'000**
අමුද්‍රව්‍ය ගැනුම්	1 500
සෘජු ශ්‍රමය	300
අමු ද්‍රව්‍ය ගෙන ඒමේ කුළී	100
ගංවතුර තත්ත්වයක් හේතුවෙන් විනාශ වූ අමු ද්‍රව්‍ය පිරිවැය	200
පොත් රාක්ක 100 සඳහා වෙන් කළ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය	600

තවද අදාළ ගනුදෙනුකරුගේ විශේෂ අවශ්‍යතාව අනුව මෙම පොත් රාක්ක නිර්මාණය (design) කිරීම සඳහා ඒ සම්බන්ධ බාහිර නිර්මාණ ශිල්පියෙකුට රු. 50 000 මුදලක් ගෙවා ඇත. මෙම ඇණවුම සමාගමට ලබා ගැනීමට මුල් වූ තැරැව්කරු වෙනුවෙන් රු. 75 000 කොමිස් මුදලක් ද දැනටමත් ගෙවා ඇත.
2025 මාර්තු 31 දින වන විට පොත් රාක්ක 100 ක නිෂ්පාදන කටයුතු සම්පූර්ණයෙන් අවසන් වූ අතර අදාළ ගනුදෙනුකරුට මෙම ඇණවුම අප්‍රේල් මස 10 වන දින බෙදාහැරීමට නියමිත ය. 2025 මාර්තු 31 දිනට ඉතිරි අමුද්‍රව්‍ය තොග නොතිබූ බවට උපකල්පනය කරන්න.

LKAS 02 තොග ප්‍රමිතියට අනුව 2025.03.31 දිනට මෙම පොත් රාක්ක තොගයේ පිරිවැය,

(1). රු. 2 350 000
(2). රු. 2 425 000
(3). රු. 2 700 000
(4). රු. 2 750 000
(5). රු. 2 850 000

(.........)

19. LKAS 07 - "මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් ප්‍රමිතියට" අනුව පහත කුමන අයිතම **මූල්‍ය ක්‍රියාකාරකම්** තුළින් ඇතිවන මුදල් ප්‍රවාහ ලෙස වර්ග කල යුතු ද?

A. ගෙවූ අතුරු ලාභාංශ
B. වෙනත් සමාගම්වල සාමාන්‍ය කොටස් මිල දී ගැනීමට ගෙවූ මුදල්
C. බැංකු ණයක් හරහා සමාගමට ලැබුණු මුදල්
D. බැංකුවක ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම සඳහා යෙදවූ මුදල්

(1). A හා B පමණි
(2). A හා C පමණි
(3). B හා D පමණි
(4). C හා D පමණි
(5). B හා C පමණි

(.........)

20. 2005.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමා සහිත හීරෝ සමාගමේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා 2025.06.02 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබිණි.
තවද මෙම සමාගමට අදාළ පහත තොරතුරු සපයා ඇත.

- 2025.04.05 වන දින සමාගමෙන් රු.200 000ක භාණ්ඩ ණයට මිල දී ගත් ණයගැතියෙකු බුන්වත් වී ඇති බව 2025.05.10 වන දින ප්‍රකාශයට පත් කරන ලදී.
- 2025.04.30 සුළි කුණාටුවක් හේතුවෙන් රු 250 000කට මිලදී ගත් යන්ත්‍රයක් සම්පූර්ණයෙන් විනාශ විය. 2025.03.31 දිනට මෙම යන්ත්‍රයෙහි ධාරණ වටිනාකම රු 200 000 කි.
- 2025.03.01 දින රු.600 000 කට අලෙවි කර භාණ්ඩ තොග එහි **පිරිවිතරයේ(standard)** ඇති වූ අඩුපාඩුවක් නිසා 2025.04.15 දින අදාළ ගනුදෙනුකරු විසින් නැවත එවීම. මෙම විකුණුම් මිලෙහි ඇතුළත් **ලාභ කොටස (profit margin)** රු. 75 000 කි.

ඉහත සිදුවීම් සැලකිල්ලට ගැනීමට පෙර 2025.03.31 දිනට අවසන් වර්ෂය සඳහා ලාභය රු.1 500 000 කි

LKAS 10 – 'වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්' ප්‍රමිතියට අනුව ගැලපීම් සිදු කිරීමෙන් පසු 2025.03.31 අවසන් වර්ෂය සඳහා නිවැරදි ලාභය කොපමණ ද?

(1). රු. 650 000

(2). රු. 900 000

(3). රු. 1 100 000

(4). රු. 1 425 000

(5). රු. 1 500 000

(.........)

21. සීමාසහිත කමල් සමාගම මුද්‍රණ යන්ත්‍රයක් 2024.10.01 දින ගනුදෙනුකරුවෙකුට විකුණන ලදී. මෙහි දී කමල් සමාගම විසින් මුද්‍රණ යන්ත්‍රයේ විකුණුම් දින සිට ඉදිරි වසර 2ක් සඳහා මාස 06කට වරක් සම්පූර්ණ නඩත්තු කටයුතු වාර 4ක් සිදු කිරීමට ද එකඟ විය. මේ සඳහා සම්පූර්ණ මුදල වශයෙන් රු. 600 000 ක් අය කිරීමට සමාගම සහ ගනුදෙනුකරු එකඟ විය.

සීමාසහිත කමල් සමාගම මෙම වර්ෂයේම මුද්‍රණ යන්ත්‍රයක් නඩත්තු සේවා රහිත ගනුදෙනුවකදී 450 000 කට අලෙවි කරන අතර, මෙම වර්ගයේ මුද්‍රණ යන්ත්‍රයක් නඩත්තු කිරීමේ සේවාව සපයන ගනුදෙනුවක් සඳහා එක් නඩත්තු වාරයකට රු 37 500 ක මුදලක් අය කරනු ලබයි.

2025.03.31 දින වන විට කමල් සමාගම මෙම ගනුදෙනුකරුට පළමු නඩත්තු සේවාව ද සපයා අවසන් කොට ඇත.

SLFRS 15 – 'ගනුදෙනුකරුවන් සමග ගිවිසුම්වලින් අයභාරය' ප්‍රමිතියට අනුව සීමිත කමල් සමාගම 2025.03.31 න් අවසන් වර්ෂය සඳහා මෙම ගිවිසුමෙන් හඳුනා ගත යුතු අයභාරය වන්නේ;

(1) රු. 406 250

(2) රු. 450 000

(3) රු. 487 500

(4) රු. 525 000

(5) රු. 600 000

(.........)

22. සීමිත සමීර පොදු සමාගම වසර 05 ක කාලයකට මෝටර් රථයක භාවිත අයිතිය ලබා ගැනීම සඳහා 2025.03.31 වන දින කල්බදු ගිවිසුමකට එළඹෙන ලදී. ඒ සඳහා එම දිනයේම රු. 2 000 000 මූලික ගෙවීමක් සිදු කරන ලදී. තවද කල්බදු ගිවිසුමට අනුව රු. 110 000 බැගින් වූ වාර්ෂික කල්බදු වාරික 5ක් කල්බදු කාල සීමාව තුළ ගෙවිය යුතු අතර, පළමු වාරිකය 2026.03.31 දින ගෙවිය යුතු ය. මෙම ගිවිසුමට අදාළ ගම්‍ය පොළී අනුපාතය 10% වන අතර ඒ අනුව ගණනය කළ ගිවිසුමට අදාළ මුළු පොළිය රු. 133 013 ක් ද පළමු වසරට පොළිය රු. 41 699 ද වේ.

SLFRS 16 – ‘කල්බදු’ ප්‍රමිතයට අනුව 2025.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් ලෙස නිරූපණය කරනු ලබන කල්බදු වගකීම;

(1) රු. 348 686

(2) රු. 416 987

(3) රු. 447 000

(4) රු. 550 000

(5) රු.2 440 000

(.........)

23. සීමිත සසිරි පොදු සමාගමේ පොත්වලින් 2024.03.31 දිනට හා 2025.03.31 දිනට පහත තොරතුරු උපුටා ගෙන ඇත.

	(රු'000) 2025.03.31	(රු'000) 2024.03.31
ප්‍රකාශිත සා/කො ප්‍රාග්ධනය	12 500	10 000
රඳවාගත් ඉපයුම්	6 500	6 000
දේපළ පිරියත හා උපකරණ (පිරිවැයට)	25 000	20 000
දේපළ පිරියත හා උපකරණ (සමුච්චිත ක්ෂය)	2 500	2 000
බදු තොගය	1 500	1 000
වෙළඳ ලැබිය යුතු දෑ	2 000	3 000
වෙළඳ ගෙවිය යුතු දෑ	2 000	1 500

1. 2024/2025 වර්ෂය තුළදී රඳවාගත් ඉපයුම් ප්‍රාග්ධනිත කරමින් රු.1 000 000 කොටස් නිකුත් කර ඇත.
2. 2024/04/01 දිනට රු.5 000 000 ක මෝටර් රථයක් මිලට ගැනීම හැර දේපළ පිරියත උපකරණ සම්බන්ධයෙන් වෙනත් සංචලනයන් සිදු වී නොමැත.
3. 2024/2025 වර්ෂය තුළදී රු.500 000 ලාභාංශ ගෙවීමක් සිදුකර ඇති අතර 2025.03.31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් රු.60 000 ක ලාභාංශ ගෙවීමට යෝජනා කර ඇත.

සමාගම ආදායම් බදුවලින් නිදහස් කර ඇත.

LKAS 07 ″මුදල් ප්‍රවාහ ප්‍රකාශන″ ප්‍රමිතයට අනුව 2025.03.31 න් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය වන්නේ;

1. රු. 3 000 000 2. රු. 3 500 000 3. රු. 4 000 000

4. රු. 4 500 000 3. රු. 5 100 000

(.........)

24. 2024.04.01 දින ආරම්භ කළ සීමිත ජයා සමාගමේ 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජංගම අනුපාතය 2.5:1 වන අතර, ක්ෂණික අනුපාතය 1.5:1 වේ. නමුත් ඉහත අනුපාත ගණනය කිරීමේ දී ව්‍යාපාරයේ පවතින තොගය දෙවරක් ඊට ඇතුළත් කර ඇති අතර, ඉදිරියට කළ ගෙවීම් රු.30 000 ක් ඇතුළත් කිරීම මඟහැරී ඇත.
ව්‍යාපාරයේ ජංගම වගකීම් රු.200 000 ක් නම් නිවැරදි ජංගම අනුපාතය වන්නේ,

(1) 1.7 : 1 (2) 1.9 :1 (3) 2 : 1 4. 2.1 : 1 (5) 2.15 : 1

(.........)

25. මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණයට අදාළ පහත ප්‍රකාශවලින් කුමන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද ?

A. කළමනාකරණ ගිණුම්කරණය, ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කරන ලද තොරතුරු සපයයි.

B. මූල්‍ය ගිණුම්කරණය මඟින් කළමනාකරණ ගිණුම්කරණයට අවශ්‍ය තොරතුරු සපයයි.

C. කළමනාකරණ ගිණුම්කරණය මඟින් ඓතිහාසික හා පුරෝකථන තොරතුරු සපයයි.

D.මූල්‍ය ගිණුම්කරණය මඟින් කළමනාකරණයට අවශ්‍ය අවස්ථාවල දී අවශ්‍ය විශ්ලේෂණාත්මක තොරතුරු සපයයි.

1. A පමණි. 2. A හා B පමණි. 3. B හා C පමණි.
4. C හා D පමණි. 5. A,B හා D පමණි.

(.........)

26. සෙනුකි සමාගමේ P නමැති භාණ්ඩය නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍යයක් ලෙස යොදා ගන්නා x නමැති ද්‍රව්‍ය සම්බන්ධයෙන් පොත්වලින් පහත තොරතුරු උපුටාගෙන ඇත.

මාසික නිෂ්පාදනය ඒකක 30 කි.
P ඒකකයක් නිපදවීම සඳහා අවශ්‍ය x අමුද්‍රව්‍ය ප්‍රමාණය 10kg
ඇණවුමක පවතින ඒකක ගණන 200 හිදී එක් ඇණවුමක පිරිවැය රු. 100
ඒකකයක් වාර්ෂිකව රඳවා ගැනීමේ පිරිවැය රු.2

x අමුද්‍රව්‍යයට අදාළ ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) සහ ඇණවුම් වාර ගණන පිළිවෙළින්;

1. ඒකක 173 වාර 06 2. ඒකක 189 වාර 06 3. ඒකක 245 වාර 18
4. ඒකක 600 වාර 06 5. ඒකක 610 වාර 18

(.........)

27. පහත දැක්වෙන්නේ විසිනි විදාරා ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අලෙවි සමාගමේ 2025 ජූනි මාසයට අදාළ වැටුප් ලේඛනයෙන් උපුටාගත් සාරාංශ ගත තොරතුරු ය.

	රු. 000
මූලික වැටුප	650
අතිකාල දීමනා	100
පැමිණීමේ දීමනා	50
දළ වැටුප	800
අඩු කිරීම්	
සේවක ණය වාරික	180
EPF සේවක දායක	70
නිල නිවාස කුළිය	50
	300
ශුද්ධ වැටුප	500

ආයතනය සතු නිල නිවාස සේවකයින් සඳහා ලබා දී ඇති අතර, සේවකයින් පස් දෙනෙකු නිල නිවාසවල වාසය කිරීම වෙනුවෙන් මාසිකව රු. 10 000 ක කුලියක් අය කරයි. සේවක වැටුප් ගෙවිය යුතුව ඇත.

ඉහත තොරතුරු අනුව වැටුප් ගිණුම්ගත කිරීමට අදාළ නිවැරදි ජර්නල් සටහන වන්නේ,

1. වැටුප් ගිණුම හර 800

    මුදල් ගිණුම බැර 800

2. වැටුප් ගිණුම හර 650

    දීමනා ගිණුම හර 150

    සේවක ණය ගිණුම බැර 180

    උපචිත EPF ගිණුම බැර 70

    උපචිත නිල නිවාස කුලී බැර 50

    මුදල් ගිණුම බැර 500

3. වැටුප් ගිණුම හර 800

    සේවක ණය ගිණුම බැර 180

    උපචිත EPF ගිණුම බැර 70

    නිවාස කුලී ආදායම් ගිණුම බැර 50

    මුදල් බැර 500

4. වැටුප් ගිණුම හර 800

    සේවක ණය ගිණුම බැර 180

    උපචිත EPF ගිණුම බැර 70

    නිවාස කුලී ආදයම් බැර 50

    උපචිත වැටුප් ගිණුම බැර 500

5. වැටුප් ගිණුම හර 800

    සේවක ණය ගිණුම බැර 180

    උපචිත EPF ගිණුම බැර 70

    ගෙවිය යුතු නිවාස කුලී වියදම් ගිණුම බැර 50

    උපචිත වැටුප් බැර 500

(.........)

28. එකලස් හා නිමවුම් යන නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් පවතින සීමිත නිශාදි ව්‍යාපාරයේ 2024 මැයි මාසයේ අන්තර්ග්‍රහණය කළ මුළු පොදුකාර්ය පිරිවැය පහත පරිදි වේ.

එකලස් අංශය (යන්ත්‍ර පැය පදනමට) රු.300 000

නිමැවුම් අංශය (ශ්‍රම පැය පදනමට) රු. 512 000

ඒකකයක පිරිවැය සම්බන්ධව පහත තොරතුරු සපයා ඇත.

	අයවැය ගත පැය	සත්‍ය පැය
යන්ත්‍ර	5	5
ශ්‍රම	4	7

මැයි මාසයේ අයවැය ගත නිෂ්පාදන ඒකක 4 000 සහ සත්‍ය වශයෙන්ම නිපද වූ ඒකක 3 000 වේ. ඒකකයක ප්‍රාථමික පිරිවැය රු.300 ක් නම් ඒකකයක මුළු පිරිවැය කොපමණ ද?

1. රු. 299 2. රු.503 3. රු.599
4. රු. 600 5. රු.1 571

(.........)

29. සීමිත සතුදි සමාගම K නමින් තනි භාණ්ඩයක් නිපදවා අලෙවි කරන අතර, ඊට අදාළව පහත තොරතුරු සපයා ඇත.

විකුණුම් ඒකක ගණන	ලාභය/අලාභය (රු.)
500	(50 000)
1 200	20 000

- ඒකකයක විකුණුම් මිල රු. 160 කි

සමච්ඡේදන ලක්ෂයට අදාළ ඒකක ගණන වන්නේ;

1. ඒකක 100 2. ඒකක 500 3. ඒකක 700
4. ඒකක 1 000 5. ඒකක 1 200

(.........)

30. සීමිත යශ්විද සමාගමේ මූල්‍ය අධ්‍යක්ෂවරයා විසින් රු.180 000කට නව යන්ත්‍රයක් මිලට ගැනීමේ අපේක්ෂාවෙන් සිටී.

මෙම නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වසර 03කි.

එහි සුන්බුන් අගයක් නොමැත.

සරල මාර්ග ක්‍රමය යටතේ යන්ත්‍ර ක්ෂය කරනු ලබයි.

අතිරේක තොරතුරු

වර්ෂය	විකුණුම් වැඩිවීම (රු.)	ක්ෂය හැර මෙහෙයුම් වියදම් වැඩිවීම (රු.)
1	150 000	50 000
2	100 000	20 000
3	150 000	60 000

මෙම යන්ත්‍රයට අදාළ ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය සාමාන්‍ය ආයෝජනය මත වන්නේ;

1. 11.11% 2. 16.67% 3. 20%
4. 22.22% 5. 33.33%

(.........)

31. පහත වගන්ති සම්පූර්ණ කරන්න.

A - පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන මඟින් තොරතුරු සපයනු ලබන්නේ, දැනට සිටින සහ අපේක්ෂිත ආයෝජකයන්ට,.. සහ .... ය.

B - පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන මඟින් ඉහත පාර්ශ්වයන්ට, වාර්තාකරණ ඒකකයට අදාළව .... පිළිබඳ තීරණ ගැනීමට අවශ්‍ය වන .... තොරතුරු සැපයීම කෙරේ.

32. තනි පුද්ගල වෙළෙඳ ව්‍යාපාරයක පහත සඳහන් ශේෂ සහ ගනුදෙනු දී ඇත.

2024.01.01 ශේෂ - විකුණුම් අත්තිකාරම් රු.100 000
උපචිත විදුලි ගාස්තු රු.50 000

ගනුදෙනු

(1) ඉහත විකුණුම් අත්තිකාරමට අදාළ, රු.380 000 ක් විකුණුම් මිල වූ භාණ්ඩ ගනුදෙනුකරු වෙත භාර දී මුදල් ලබා ගන්නා ලදී. (එම භාණ්ඩවල පිරිවැය රු.300 000කි.)

(2) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විදුලි වියදම රු.175 000 ක් වූ අතර 2025.03.31 දිනට ඉදිරියට ගෙවූ හෝ උපචිත විදුලි ගාස්තු නොමැත.

ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයේ පහත විචල්‍යයන්ට බලපාන ආකාරය දක්වන්න.

ගනුදෙනු අංකය	වගකීම්		හිමිකම්	
	අඩුවේද/වැඩිවේද	වටිනාකම (රු.)	අඩුවේද/වැඩිවේද	වටිනාකම (රු.)
(1)				
(2)				

අංක 33 සහ 34 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

ව්‍යාපාරයක වෙළෙඳ ලැබිය යුතු දෑ පිළිබඳව උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

2025.03.31 දිනට වෙළෙඳ ලැබිය යුතු දෑ උප ලෙජරයේ එකතුව රු.880 000 කි. එදිනට වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුමේ ශේෂය මෙයට වෙනස් වූ අතර පහත වැරදි සහ මඟහැරීම් පසුව සොයා ගන්නා ලදී.

(1) මුදල් ලැබීම් ජ'නලයේ සටහන් කර තිබූ **තිළිණගේ** වට්ටම රු.9 000ක් උප ලෙජරයේ ඔහුගේ ගිණුමට පිටපත් වී නොමැත.
(2) රු.100 000ක විකුණුම් ඉන්වොයිසියක් පිළිබඳව කිසිදු සටහනක් තබා නොමැත.

(3) රු.7 000ක බොල්ණය ආපසු ලැබීමක් වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුමට බැර කර ඇත.

(4) උප ලෙජරයේ **නදිනිගේ** ගිණුමේ බැර ශේෂය වූ රු.5 000 හර ශේෂයක් ලෙස සටහන් කර ඇත.

33. 2025.03.31 දිනට වෙළෙඳ ලැබිය යුතු දෑ පාලන ගිණුමේ නිවැරදි ශේෂය කොපමණ ද?

රු. ....

34. ඉහත වැරදි නිවැරදි කළ පසු ලාභයට සිදුවන බලපෑම "අඩුවේද, වැඩිවේද" යන්න සමඟින් දක්වන්න.

රු. .... කින් .... (අඩුවේ/වැඩිවේ)

35. පහත සඳහන් අයිතමයන් සටහන් කරන මූල්‍ය ප්‍රකාශන සංරචකය නම් කරන්න.

	අයිතමය	**සංරචකය**
A -	නොඉපයූ ආදායම්	....
B -	ගෙවූ ආදායම් බදු	....
C -	පොදු සංචිතයට මාරු කිරීම	....
D -	ගොඩනැගිලි පළමු වර ප්‍රත්‍යාගණන ඌනතාව	....

36. නිෂ්පාදන ව්‍යාපාරයක තොරතුරු කිහිපයක් පහත දැක් වේ.

	(රු'000)
2024.04.01 අමුද්‍රව්‍ය තොගය	3 000
2025.03.31 අමුද්‍රව්‍ය තොගය	3 500
කාලච්ඡේදය තුළ අමුද්‍රව්‍ය ගැනුම්	15 000
නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය	13 000
සෘජු ශ්‍රම පිරිවැය	2 000

- මුළු නිෂ්පාදන පිරිවැය ගණනයේ දී අමුද්‍රව්‍ය ආපසු යැවුම් රු.500 000ක් හා කම්හල් වරිපනම් රු.600 000ක් සැළකිල්ලට ගෙන නොමැත.
- ආරම්භක සහ අවසාන නොනිමි තොග නොමැත.

ඉහත තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් පසුව පහත වගන්තිවල සත්‍ය /අසත්‍ය බව සඳහන් කරන්න.

	සත්‍ය / අසත්‍ය
(1) පරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය රු.14 000 000 කි.	....
(2) ප්‍රාථමික පිරිවැය රු.15 500 000 කි.	....
(3) නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය රු.13 600 000 කි.	....
(4) මුළු නිෂ්පාදන පිරිවැය රු. 29 600 000 කි.	....

37. නිෂ්පාදන ව්‍යාපාරයක, පහත සඳහන් අවස්ථාවල දී අදාළ වන ගිණුම්කරණ සංකල්පය පැහැදිලි කරන්න.

අවස්ථාව		අදාළ වන ගිණුම්කරණ සංකල්පය
A	අවසාන තොග පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට වාර්තා කිරීම.	....
B	පාරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය සෙවීමේදී අවසාන අමුද්‍රව්‍ය තොගය ඉවත් කිරීම.	....
C	අමුද්‍රව්‍ය ගැනිලි වටිනාකම හිමිකමේ අඩුවීමක් ලෙස පෙන්නුම් කිරීම.	....
D	අවසාන ඉතිරි තොගවල වර්ගීකරණය මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්නුම් කිරීම.	....

38. 2022.04.01 දින ආරම්භ කරන ලද සුබසාධක සංගමයක අරමුදල් දෙකක් සම්බන්ධව පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

	2025.03.31	2024.03.31
	(රු'000)	(රු'000)
යාවජීව සාමාජික මුදල්	3 000	3 600
පුස්තකාල ගොඩනැගිලි අරමුදල	1 500	1 200

අතිරේක තොරතුරු

(1) සංගමය ආරම්භක දින දී ලද යාවජීව සාමාජික මුදල් වර්ෂ 8 ක් පුරා ආදායම් ලෙස හඳුනා ගනී.

(2) 2025.03.30 දින රු.1 400 000 ක් වැය කර පුස්තකාල ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් ඉදිකර අවසන් කර ඇත. වර්ෂය තුළ පුස්තකාල ගොඩනැගිලි අරමුදලට පරිත්‍යාග ලැබී ඇති අතර, පුස්තකාල අරමුදලින් කිසිවක් සමුච්චිත අරමුදලට මාරු කර නොමැත.

පහත දෑ හඳුනා ගන්න.

A	සංගමය ආරම්භක දින දී ලද මුළු යාවජීව සාමාජික මුදල	රු. ....
B	2025.03.31 දිනට සමුච්චිත අරමුදලට මාරු කළ යුතු පුස්තකාල ගොඩනැගිලි අරමුදල් වටිනාකම	රු. ....

- අංක 39 සහ 40 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.

ජමීල්, අරෝෂ් සහ බිනර පිළිවෙළින් 3:2:1 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් පවත්වා ගෙන ආ හවුල් ව්‍යාපාරයෙන් 2025.03.31 දින අරෝෂ් විශ්‍රාම ගන්නා ලදී. එදින කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැලපීම හේතුවෙන් අරෝෂ්ගේ හිමිකම රු.400 000කින් වැඩි වූ අතර, බිනරගේ හිමිකම රු.400 000කින් අඩු විය. 2025.03.31 දිනට තිබූ අරෝෂ්ගේ ජංගම ගිණුමේ හර ශේෂය රු.200 000 ක් ප්‍රාග්ධන ගිණුමට මාරු කර ඇත. විශ්‍රාම ගන්නා දින රු.650 000 ක් වූ ධාරණ අගය වූ උපකරණයක් රු.600 000ක වටිනාකමට අරෝෂ්ට පවරා දුන් අතර ඉතිරි මුදල 10%ක් පොලී සහිත ණය ගිණුමකට මාරු කරන ලදී. 2025.03.31 දිනට ජමීල් සහ බිනරගේ ප්‍රාග්ධන ශේෂයන් රු.5 000 බැගින් විය.

39. (අ) අරෝෂ් විශ්‍රාම ගන්නා දින ඇස්තමේන්තු කළ මුළු කීර්තිනාමයේ අගය කොපමණ ද?

රු. ....

(ආ) 2024.04.01 දිනට අරෝෂ්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු.4 500 000 නම් 2025.03.31 දිනට අරෝෂ්ගේ ණය ගිණුමේ ශේෂය කොපමණ ද? රු..................................

40. (අ) 2024.04.01 දිනට ජමීල්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය වන්නේ රු. .... කි.

(ආ) 2024.04.01 දිනට බිනරගේ ප්‍රාග්ධන ශේෂය රු.4 000 000ක් නම් සහ බිනර 2025.03.31 දින රු.500 000 භාණ්ඩ තොගයක් අමතර ප්‍රාග්ධනය ලෙස යොදා ඇත්නම් එදින ඔහු මුදලින් යෙදූ අමතර ප්‍රාග්ධනය වන්නේ රු...කි.

41. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව (2018) ට අනුව පහත වගන්ති සම්පූර්ණ කරන්න

A. මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ගති ලක්ෂණ දෙක "විශ්වසනීය නියෝජ්‍යත්වය" සහ .... වේ.
B. ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමේ හව්‍යතාව සඳහා ඇති අයිතිය .... ලෙස නිර්වචනය කෙරේ.
C. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සාමාන්‍යයෙන් අනුගමනය කරන උපකල්පනය වන්නේ ....යි
D. මූල්‍ය තොරතුරු තීරණ ගන්නා පාර්ශ්වයන්ට ප්‍රමාදයකින් තොරව නියමිත කාලයේ දී ලබා දිය යුතු බවට දක්වන මූල්‍ය තොරතුරුවල ගුණාත්මක බව වැඩි කිරීමේ ලක්ෂණය වන්නේ....................................යි

42. LKAS 08 – 'ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි' ප්‍රමිතියට අනුව පහත එක් එක් අවස්ථාව ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීමක් ද ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීමක් ද යන්න සඳහන් කරන්න

අවස්ථාව	ගිණුම්කරණප්‍රතිපත්ති/ ඇස්තමේන්තු වෙනස් වීමක්
A. දේපළ පිරියත සහ උපකරණ මිනුම් කිරීමේ ක්‍රමය පිරිවැය ආකෘතියේ සිට ප්‍රත්‍යාගණන ආකෘතියට වෙනස් කිරීම	....
B. තොග පිරිවැය මිනුම් කිරීමේ ක්‍රමය පෙර පිවිසි පෙර පිට (FIFO) සිට බර තැබීමේ සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමයට වෙනස් කිරීම	....
C. ඵලදායී ජීව කාලය වසර 05ක් ලෙස තීරණය කොට තිබූ යන්ත්‍රයක ඵලදායී ජීව කාලය වසර 08ක් ලෙස දීර්ඝ කිරීමට තීරණය කර තිබීම	....

D. සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරමින් පැවැති යන්ත්‍රයක් ප්‍රවර්තන වර්ෂයේ සිට හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කිරීමට තීරණය කිරීම ....

43. සීමාසහිත මෙගා සමාගම 2025.01.01 දින නව නිෂ්පාදන යන්ත්‍රයක් මිලදී ගත් අතර, ඊට අදාළ විස්තර පහත දක්වා ඇත.

	රු.
යන්ත්‍රය මිලදී ගත් ආයතනයට ගෙවූ මිල (ඉන්වොයිසිය අනුව)	1 000 000
යන්ත්‍රය සමාගමට ගෙන ඒමේ කුළිය	50 000
යන්ත්‍රය ස්ථාපනය කිරීම සඳහා කර්මාන්ත ශාලාවේ පරිශ්‍රය පිළියෙළ කිරීමේ පිරිවැය (Site Preparation)	200 000

2025.01.01 දිනට අදාළ යන්ත්‍රය කර්මාන්ත ශාලාවේ ස්ථාපනය කිරීම අවසන්කොට භාවිත කිරීමට සුදුසු තත්ත්වයට පත්වූ නමුත් අමුද්‍රව්‍ය සැපයීමේ සිදු වූ ප්‍රමාදයක් නිසා නව යන්ත්‍රය භාවිතයට ගැනීම ආරම්භ වූයේ 2025.02.01 දී ය. තවද මෙම යන්ත්‍රය සැපයූ ආයතනය විසින් යන්ත්‍රය සඳහා වසර 10ක වගකීමක් ලබා දී ඇති නමුත් මෙගා සමාගමේ කළමනාකරණය විසින් මෙම යන්ත්‍රය ඉදිරි වසර 5ක කාලයක් සඳහා පමණක් නිෂ්පාදන කටයුතුවලට යොදා ගැනීමට ඇස්තමේන්තු කර ඇත.

LKAS 16 - දේපළ පිරියත සහ උපකරණ ප්‍රමිතියට අනුව මෙම නව යන්ත්‍රයට අදාළව පහත දෑ සඳහන් කරන්න.

a. හඳුනාගන්නා අවස්ථාවේ යන්ත්‍රය මිනුම් කරන වටිනාකම (රු.) ....

b. ඵලදායී ජීව කාලය (වර්ෂ)....................................

c. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂය වියදම (රු.) ....

44. මෘදුකාංග සංවර්ධනය කිරීමේ නිරත සීමිත පෙරේරා සමාගම තම ගනුදෙනුකරුවකු සමග ගිණුම් පිළියෙළ කිරීමේ මෘදුකාංගයක් (Accounting Software) සහ වැටුප් පිළියෙල කිරීමේ මෘදුකාංගයක් (Payroll software) සංවර්ධනය කිරීම සඳහා 2025.01.01 දින ගිවිසුමකට එළඹෙන ලදී. මෙම ගිවිසුමට අදාළ එකඟතාවයන් ඊට අදාළව එකඟ වූ වටිනාකම් පහත දක්වා ඇත.

<u>ගිණුම් පිළියෙල කිරීමේ මෘදුකාංගය</u>	(රු.)
මෘදුකාංගය සංවර්ධනය කොට බලපත්‍රය ලබා දීම (Software development and license)	800 000
මෘදුකාංගය ගනුදෙනුකරුගේ පරිගණක පද්ධතියේ ස්ථාපනය කර දීම (installation)	200 000
<u>වැටුප් සැකසීමේ මෘදුකාංගය</u>	
මෘදුකාංගය සංවර්ධනය කොට බලපත්‍රය ලබා දීම	400 000
මෘදුකාංගය ගනුදෙනුකරුගේ පරිගණක පද්ධතියේ ස්ථාපනය කර දීම	100 000

ඒ අනුව ගිවිසුමේ මුළු වටිනාකම රු.1 500 000කි. තවද, මෙම මෘදුකාංග ගනුදෙනුකරුගේ පරිගණක පද්ධතියේ ස්ථාපනය කරන අවස්ථාවේ ඊට අදාළව සීරුමාරු කිරීමේ (configuration and customization) අවශ්‍යතාවක් පවතින අතර, ඒ සඳහා හැකියාව පවතින්නේ මෘදුකාංග සංවර්ධනය කල සීමිත පෙරේරා සමාගමට පමණි.

2025.03.31 දින වන විට මෘදුකාංග දෙකම සංවර්ධනය අවසන් කොට ගනුදෙනුකරුට බලපත්‍ර ලබා දී තිබූ අතර, එදින වන විට ස්ථාපනය (Installation) අවසන් කොට තිබුණේ ගිණුම් පිළියෙල කිරීමේ මෘදුකාංගයේ පමණි. මෙම ගිවිසුම සඳහා රු.1 400 000ක අත්තිකාරමක් සමාගම 2025.01.01 දින ගනුදෙනුකරුගෙන් ලබාගෙන ඇත.

SLFRS 15 'ගනුදෙනුකරුවන් සමග ගිවිසුම්වලින් අයභාරය' ප්‍රමිතියට අනුව මෙම ගිවිසුම සඳහා පහත සඳහන් දෑ හඳුනා ගන්න.

(අ) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත යුතු අයභාරය රු. ....

(ආ) 2025.03.31 දිනට නොඉපයූ අයභාරය රු. ....

45. සීමිත සමන් සමාගම බේකරි අහාර නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

LKAS 37 'ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්' ප්‍රමිතියට අනුව පහත එක් එක් අවස්ථාවේ දී 2025.03.31 දිනට ප්‍රතිපාදනයක් හෝ අසම්භව්‍ය වගකීමක් හෝ අසම්භව්‍ය වත්කමක් ඇතිවන්නේ ද යන්න හේතු සහිතව සඳහන් කරන්න.

A. මෙම සමාගමෙන් අලෙවි කරන ලද ආහාර විෂවීමක් සම්බන්ධයෙන් ගනුදෙනුකරුවෙක් සමාගමට එරෙහිව නඩු පවරා ඇත. එම නඩුව 2025 ජුනි මාසයේ දී කැඳවීමට නියමිත අතර, සමාගම නඩුව පරාජය වුවහොත් සැලකිය යුතු වන්දියක් ගනුදෙනුකරු වෙත ගෙවීමට සිදුවනු ඇත. එහෙත් නඩු තීන්දුව ලැබෙන තෙක් ඒ පිළිබඳව නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි බව සමන් සමාගමේ නීතිඥවරුන්ගේ මතයයි.

B. 2025 ජනවාරි මාසයේ සමාගමේ එක් බේකරියක ඇති වූ ගින්නක් හේතුවෙන් ආහාර නිෂ්පාදනය කිරීමේ දී භාවිත කළ පෝරණුවක් සම්පූර්ණයෙන්ම විනාශ වූ අතර, ඒ වෙනුවෙන් සමාගම දැනටමත් රු. 200 000 වන්දි මුදලක් අදාළ රක්ෂණ සමාගමෙන් ඉල්ලා ඇත. 2025.03.31 දින වන විටත් රක්ෂණ සමාගම සමන් සමාගමේ අයදුම්පත සලකා බලමින් පැවැති අතර ඉල්ලා ඇති වන්දි මුදල ගෙවීමේ වැඩි සම්භාවිතාව පවතින බව සමන් සමාගමේ මතයයි.

අවස්ථාව	ප්‍රතිපාදන/ අසම්භව්‍ය වගකීම් අසම්භව්‍ය වත්කම්	හේතුව
A	....	....
B	....	....

46. ගිණුම්කරණ අනුපාත විශ්ලේෂණය හා සම්බන්ධ පහත ප්‍රකාශ සත්‍ය ද / අසත්‍ය ද යන්න දක්වන්න.

1. ණයට විකුණුම් මඟින් ජංගම අනුපාතය වැඩි වේ. ( )
2. ඉහළ තොග පිරිවැටුම් අනුපාතයක් මඟින් ඉහළ තොග රඳවා ගැනීමේ කාලයක් පෙන්වයි. ( )
3. ණය හිමිකම් අනුපාතය ඉහළ යාම හිතකර මූල්‍ය තත්ත්වයකි. ( )
4. වසර අවසාන තොගය ශුද්ධ උපලබ්ධි අගයට පෙන්වීම දළ ලාභ අනුපාතයට බලපෑමක් ඇති කරයි. ( )

47. නිෂ්පාදන සමාගමක් **x** නමැති භාණ්ඩය නිපදවන අතර ඒ සඳහා නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් හා එක් සේවා දෙපාර්තමේන්තුවක් පවත්වා ගෙන යනු ලබයි. ඒ සම්බන්ධයෙන් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

	නිෂ්පාදන දෙපාර්තමේන්තුව		සේවා දෙපාර්තමේන්තුව
	එකලස්	නිමවුම්	ගබඩා
අයවැයගත පො.කා.පි.	180 000	125 000	100 000
ද්‍රව්‍ය අධියාචනා පත්‍ර	300	200	

පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය - යන්ත්‍ර පැයකට රු.22.50
ශ්‍රම පැයකට රු.25

පසුව කරන ලද පරීක්ෂාවක දී පොදු කාර්ය පිරිවැය ප්‍රාථමික විභජනය පමණක් සිදු කර ඇති බව අනාවරණය විය.

එකලස් දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය පදනම මත ද, නිමැවුම් දෙපාර්තමේන්තුව ශ්‍රම පැය පදනම මත ද පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරනු ලබයි.

x භාණ්ඩය නිපදවීම සඳහා යන්ත්‍ර පැය 10ක් ද ශ්‍රම පැය 05ක් ද අවශ්‍ය වේ.

- පහත දෑ දක්වන්න

1. එකලස් දෙපාර්තමේන්තුවට අදාළ පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය ....
2. x භාණ්ඩ ඒකකයකට අදාළ මුළු පොදු කාර්ය පිරිවැය රු. ....

48. චාන්දනී සමාගම විශේෂ ආරක්ෂිත සෙරෙප්පු වර්ගයක් නිපදවීමට ගන්නා අමුද්‍රව්‍යයක් සම්බන්ධයෙන් වන තොරතුරු පහත වේ.

සතියක සාමාන්‍ය පරිභෝජනය	1200 Kg
සාමාන්‍ය පොරොත්තු කාලය	සති 05
අවම පොරොත්තු කාලය	සති 02
අවම පරිභෝජනය (සතියක)	400 Kg
යළි ඇණවුම් ප්‍රමාණය	300 Kg

- පහත දෑ ගණනය කරන්න

1. යළි ඇණවුම් මට්ටම.............................
2. උපරිම තොග මට්ටම.................................
3. අවම තොග මට්ටම...............................
4. සාමාන්‍ය තොග මට්ටම..............................

49. ලෙහෙන්සා ඇඟලුම් නිෂ්පාදන ආයතනය විශේෂිත වර්ගයේ ජැකට් වර්ගයක් නිපදවනු ලබන අතර ඊට අදාළ තොරතුරු පහත වේ.

විකුණුම් ඒකක	මුලු පිරිවැය (රු.)
100	150 000
150	180 000

දායක විකුණුම් අනුපාතය 40%

1. සමච්ඡේද ලක්ෂය ඒකකවලින්
2. රු.48 000ක ලාභයක් ලැබීමට විකිණිය යුතු ජැකට් ගණන

50. විදාරා සමාගම පානීය ජල බෝතල් නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා පවතින යන්ත්‍රයක් වෙනුවට නව යන්ත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරයි. ඊට අදාළ තොරතුරු පහත දැක් වේ.

නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය	වර්ෂ 05කි
පැරණි යන්ත්‍රයේ විකුණුම් මිල	රු.180 000
නව යන්ත්‍රයේ ගැනුම් මිල	රු.600 000
සවිකිරීම් ගාස්තු	රු. 48 000
කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව	රු 120 000
පැරණි යන්ත්‍රයේ විකුණුම් මිල මත ගෙවිය යුතු බදු	රු.30 000
නව යන්ත්‍රයේ සුන්බුන් අගය	රු. 10 000
වාර්ෂිකව මුදල් ලැබීම් ප්‍රවාහය	රු.300 000

අවශ්‍ය වන්නේ,

1. මූලික ආයෝජනය රු. ....
2. පස්වන වර්ෂයේ මුදල් ගලා ඒම රු. ....

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2025

General Certificate of Education (Adv. Level) Examination 2025

පෙරහුරු ප්‍රශ්න පත්‍රය

Practice Question Paper

ගිණුම්කරණය II
Accounting II

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
Additional Reading Time - 10 minutes

පැය තුනයි
Three hours

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදන්න

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

උපදෙස් :

පළමුවන හා **දෙවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.

අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමග අමුණන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200**ක් හිමිවේ.

1. සීමා සහිත දිලන පොදු සමාගම VAT ලියාපදිංචි සමාගමක් වන අතර 2025.03.31 දිනට සමාගමේ සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

(රු. 000)

	හර	බැර
දේපල පිරියත හා උපකරණ (පිරිවැය / අගය)	90 000	
විකුණුම් (VAT සහිත)		88 500
2025.03.31 දිනට සමුච්චිත ක්ෂය		22 250
විකුණුම් පිරිවැය	43 000	
වෙළෙඳ ණයගැතියෝ	16 000	
කල්බදු ගෙවීම	1 000	
වෙළෙඳ ණයහිමියෝ		11 000
මෝටර් රථයක් විකුණා ලද මුදල		2 000
පරිපාලන වියදම්	13 500	
මුදල් සහ මුදල් සමාන දෑ	2 300	
බෙදාහැරීම් පිරිවැය	1 4 000	
මූල්‍ය වියදම්	1 000	
වෙනත් වියදම්	1 500	
ගෙවූ ආදායම් බදු	1 900	
2024.04.01 දිනට ආදායම් බදු වෙන්කිරීම		500
තොගය	4 800	

2024.04.01 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන		400
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය		45 000
2024.04.01 දිනට රඳවාගත් ඉපැයුම්		16 350
2024.04.01 දිනට ප්‍රත්‍යාගණන සංචිත		3 000
	189 000	189 000

අතිරේක තොරතුරු,

(i) පරිපාලන වියදම් තුළ පහත වියදම් ද ඇතුලත්ය.

අධ්‍යක්ෂ වේතන	රු. 800 000
ක්ෂය	රු.2 750 000
විගණන ගාස්තු	රු. 400 000
ගෙවූ අතුරු ලාභාංශ	රු. 1 800 000

2025.03.31 දිනට විගණන ගාස්තු රු. 100 000 උපචිතව ඇත.

(ii) භාණ්ඩ විකුණුම් වටිනාකම තුල අයකළ VAT 13 500 000 ක් ද ගැනුම් වටිනාකම තුල ගෙවූ VAT රු.8 200 000 ක් ද ඇතුළත්ය.

(iii) සමාගම විසින් 2025.01.20 දින, ජනවාරි මස 31 දින සිට අප්‍රේල් 30 දින දක්වා සෑම මසකම අවසාන දිනදී භාණ්ඩ තොග සැපයීම සඳහා ගනුදෙනුකරුවෙකු සමඟ ගිවිසුමකට එළඹ ඇත. එක් මාසයක අවසාන දින යවනු ලබන භාණ්ඩ තොගයක VAT රහිත විකුණුම් මිල රු. 300 000ක් වන අතර ගිවිසුමට එළඹුන දිනදී 18%ක VAT සහිත සියළු මුදල් ව්‍යාපාරයට ලැබී විකුණුම් ලෙස ගිණුම්ගත කර ඇත. නමුත් 2025.03.31 දින යැවිය යුතු භාණ්ඩ තොගය ඇසුරුම් කිරීමේ පමාවක් හේතුවෙන් ගනුදෙනුකරු වෙත යවා ඇත්තේ 2025.04.05 දින දීය. ප්‍රමාදය හේතුවෙන් ගනුදෙනුකරුට වූ පාඩුව සම්බන්ධයෙන් ව්‍යාපාරය සමග සමථයකට පත් වී ඇත.

(iv) 2025.03.31 දිනට රු. 500 000 ක් වූ ණයගැතියෙකු 2025.05.01 දින බුන්වත් වී ඇති බව ප්‍රකාශයට පත් කළ අතර, රු.800 000ක් පිරිවැය වූ තොග කොටසක් 2025.04.10 දින විකිණීමට හැකිවී ඇත්තේ රු.700 000 කටය.සමාගමේ අධ්‍යක්ෂවරු මූල්‍ය ප්‍රකාශන අනුමත කර ඇත්තේ 2025.05.30 දින දීය.

(v) දේපල පිරියත හා උපකරණ සංයුතිය සහ සමුච්චිත ක්ෂය පහත දැක්වේ.

	2025.03.31 දිනට පිරිවැය / අගය (රු.000)	2025.03.31 දිනට සමුච්චිත ක්ෂය (රු.000)	සරල මාර්ග ක්‍රමයට වාර්ෂික ක්ෂය අනුපාතය
ඉඩම්	40 000	-	-
ගොඩනැගිලි	25 000	9 250	5%
මෝටර් රථ	15 000	9 000	12%
කාර්යාල උපකරණ	10 000	4 000	15%

- 2025.03.31 දිනට ඉඩම් රු. 38 000 000 කට දෙවන වරට ප්‍රත්‍යාගණනය කර ඇති නමුත් මේ පිළිබඳව පොත් වල සටහන් කර නැත. මෙම ඉඩම් 2023.06.01 දින පළමු වරට ප්‍රත්‍යාගණනය කිරීමෙන් ලද අතිරික්තය රු. 1 500 000 ක් ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට බැර කර ඇත.
- 2024.10.01 දින රු. 1 920 000 ක් ධාරණ අගය වූ මෝටර් රථයක් රු. 2 000 000 කට විකුණා ඇත.විකුණන දිනට මෙය මිලදී ගෙන වර්ෂ 03 ක් ගත වී තිබුනි. ලද මුදල් ගිණුමට හර කර මෝටර් රථ විකිණීමේ ගිණුමට බැර කිරීම පමණක් කර තිබූ අතර, විකිණීම නොසලකා හැර ගණනය කරන ලද ක්ෂය වියදම බෙදාහැරීමේ වියදම් තුල ඇතුලත් කර ඇත.
- 2025.03.31 දින රු. 1 180 000 කට සමාගමේ භාවිතය සඳහා ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගත් අතර එම වටිනාකම තුළ රු. 180 000 ක් VAT ඇතුළත් වේ. එම යන්ත්‍රය මිලට ගැනීමේදී ගෙවන ලද මුළු වටිනාකම කාර්යාල උපකරණ ගිණුමට හර කර මුළු වටිනාකම සඳහාම වාර්ෂික ක්ෂය ගණනය කර ඇත.

(vi) 2024.04.01 දින කල්බදු පදනම යටතේ යන්ත්‍රයක් අත්පත් කර ගෙන ඇති අතර ඊට අදාළ තොරතුරු පහත දැක්වේ.

භාවිත අයිතිය සහිත වත්කමේ පිරිවැය	රු. 5 000 000
ඵලදායී ජීව කාලය	වර්ෂ 10
කල්බදු කාලසීමාව	වර්ෂ 5
මූලික ගෙවීම	රු. 1 000 000
වාර්ෂික කල්බදු වාරිකයක අගය	රු. 1 200 000

බදු කාල සීමාව අවසානයේ යන්ත්‍ර හිමිකම දිලන සමාගම සතුවේ.

සෑම ගිණුම් වර්ෂයක් අවසානයේදී ම වාරික මුදල් ගෙවිය යුතු අතර මෙම වර්ෂය තුළ ගෙවූ මූලික ගෙවීම පමණක් කල්බදු ගෙවීම් ගිණුමට පිටපත් කිරීම හැර වෙනත් සටහනක් තබා නැත. රු. 1 200 000 ක් වන කල් බදු වාරිකය ගෙවා ඇත්තේ 2025.04.01 දින දීය. 2024 / 2025,2025 / 2026,2026 / 2027 වර්ෂයන්ට අදාළ කල්බදු පොලී පිළිවෙලින් රු. 600 000, රු. 510 000, හා රු. 406 500 ක් වේ.

(vii) සමාගම භාණ්ඩ විකිණීමේ දී වසරක වගකීම් සහතික කාලයක් ලබා දෙන අතර 2024 / 2025 වර්ෂය තුළදී රු. 450 000 ක් වගකීම් සහතික සඳහා ගෙවා ඇති අතර එය බෙදාහැරීමේ පිරිවැය තුළ ඇතුළත් කර ඇත. 2025.03.31 දිනට වගකීම් සහතික වෙනුවෙන් වෙන් කිරීම රු. 650 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(viii) 2024 / 2025 අවසන් කාර්තුව සඳහා ආදායම් බදු වගකීම රු. 750 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ගෙවූ ආදායම් බදු තුළ 2023/2024 වර්ෂය සඳහා ගෙවූ රු. 400 000ක් ඇතුළත් වේ.

අවශ්‍ය වන්නේ,

LKAS 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අදාළ ප්‍රමිතියට අනුව සීමිත දිලන පොදු සමාගමේ ප්‍රසිද්ධ කිරීම සඳහා පහත මූල්‍ය ප්‍රකාශන සටහන්ද ඇතුළුව,

1. 2025.03.31 දිනෙන් අවසන් වසර සඳහා ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය.
2. 2025.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.
3. 2025.03.31 අවසන් වසර සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය.

(ලකුණු 40)

02. (අ) "යෝධගම එන්ටප්‍රයිසස්" ලිබඩු නිෂ්පාදන වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරයෙහි සේවකයින් 3 දෙනෙකු සේවයෙහි නියුතු අතර 2025 වර්ෂයේ මාර්තු මාසයට අදාළ සේවක වැටුප් සම්බන්ධ තොරතුරු පහත දී ඇත.

- එක් සේවකයෙකු මූලික වැටුප සඳහා මාසයකට අවම පැය 160 ක් වැඩ කළ යුතුය.

- සතියේ දිනවල සහ සති අන්ත දිනවල අතිකාල සඳහා හිමිකම් කිව හැකි අතර, අතිකාල සඳහා රේටය, සාමාන්‍ය පැයක වැටුප මෙන් 150% කි.

- මූලික වැටුප මත සේවක අර්ථ සාධක අරමුදලට (EPF) සේවකයාගෙන් 10% ක් ද සේව්‍යාගෙන් 15% ක්ද සේවා නියුක්ති භාර අරමුදලට (ETF) 3% කින්ද දායක වේ.

<u>අතිරේක තොරතුරු</u>

i)

සේවක අංකය	මාසය තුළ වැඩ කළ පැය ගණන	ජීවන වියදම් දීමනාව	EPF සේවක දායකය	සුබ සාධක සංගමයේ ගාස්තු	වැටුප් අත්තිකාරම්
01	180	20 000	8 000	2 000	50 000
02	200	20 000	7 200	2 000	_
03	170	20 000	6 400	2 000	25 000

ii) 2025 පෙබරවාරි මාසයට අදාළ ව වැටුප් සම්බන්ධ උපුටාගත් තොරතුරු පහත පරිදි වේ.

	රු.'000
මූලික වැටුප	240
අතිකාල දීමනා	95
ජීවන වියදම් දීමනා	60
EPF - සේවක	24
සේව්‍ය	36
සුභසාධක සංගමයට අයකිරීම්	06
වැටුප් අත්තිකාරම්	65

iii) මාසයට අදාළ වැටුප ඊළඟ මාසයේ 10 වන දිනද EPF හා ETF ඊළඟ මාසයේ පළමු සති දෙක තුලදී ද ගෙවනු ලැබේ.

අවශ්‍ය වන්නේ,

1) 2025 මාර්තු මස වැටුප් ලේඛනය

2) 2025 මාර්තු මාසය සඳහා වැටුප් පාලන ගිණුම, ගෙවිය යුතු වැටුප් ගිණුම, ගෙවිය යුතු EPF ගිණුම

3) 2025 මාර්තු මාසය සඳහා ආයතනයේ වැටුප් සම්බන්ධ මුළු වියදම

(ලකුණු 15)

(ආ) නිෂ්පාදන සමාගමක් විසින් 'A' හා 'B' නම් වූ භාණ්ඩ වර්ග 2 ක් නිෂ්පාදනය කරනු ලබයි. මෙම භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා 'එකලස්' සහ 'නිමවුම්' නමින් නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන දෙකක් සහ ගබඩාව යන සේවා මධ්‍යස්ථානය එකම පරිශ්‍රයක පිහිටා ඇත.

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයවැයගත පොදු කාර්ය පිරිවැය මත පදනම්ව සමාගම විසින් දැනටම ගණනය කර ඇති පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත පහත දී ඇත.

- එකලස් පිරිවැය මධ්‍යස්ථානය - යන්ත්‍ර පැයක් සඳහා රු. 45/-
- නිමැවුම් පිරිවැය මධ්‍යස්ථානය - ඍජු ශ්‍රම පැයක් සඳහා රු. 30/-

කෙසේ වුවද මෙම අනුපාතය ගණනය කිරීමේදී පහත අයවැයගත පොදු කාර්ය පිරිවැය සැලකිල්ලට ගෙන නොමැති බව පසුව අනාවරණය විය.

		රු.
-	වක්‍ර ද්‍රව්‍ය - එකලස්	රු. 186 000
	- නිමැවුම්	රු. 94 000
-	කර්මාන්තශාලා කුලිය	රු. 600 000
-	විදුලිය	රු. 450 000
-	යන්ත්‍ර ක්ෂය	රු. 700 000
-	2025 මාර්තු ගබඩා පාලක වැටුප	රු. 90 000
-	වක්‍ර වැටුප්	රු. 540 000

පිරිවැය මධ්‍යස්ථානවලට අදාළ තොරතුරු.

විස්තරය	**එකලස්**	**නිමවුම්**	**ගබඩාව**
භූමි ප්‍රමාණය(වර්ග මීටර)	1 500	1 000	500
කිලෝ වොට් පැය	6 000	5 000	4 000
සේවක සංඛ්‍යාව	30	16	8
යන්ත්‍ර පිරිවැය	රු.5 000 000	රු.2 000 000	-
අයවැයගත යන්ත්‍ර පැය	10 000	3 000	
අයවැයගත ඍජු ශ්‍රම පැය	2 500	8 000	

- ගබඩාවේ මුළු පොදු කාර්ය පිරිවැය පිළිවෙළින් එකලස් හා නිමවුම් දෙපාර්තමේන්තු අතර, 60% ක් 40% අනුපාතයට බෙදිය යුතුයි.

- එකලස් දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය මතද නිමැවුම් දෙපාර්තමේන්තුව ඍජු ශ්‍රම පැය මතද පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරනු ලබයි.

පහත තොරතුරු 'A' සහ 'B' භාණ්ඩ වලට අදාළ වේ.

	A	B
ඍජු ද්‍රව්‍ය පිරිවැය (ඒකකයකට)	800	500
ඍජු ශ්‍රම පිරිවැය (ඒකකයකට)	335	370

ඒකකයක් නිෂ්පාදනයට ගතවන සත්‍ය පැය		
- යන්ත්‍ර පැය	3	2
- ශ්‍රම පැය	2	3
ඒකකයක නිෂ්පාදන නොවන විචල්‍ය පිරිවැය	රු.120	රු.50

A භාණ්ඩයේ විකුණුම් මිල පිරිවැය මත 25% ක් ද, B භාණ්ඩයේ විකුණුම් මිල, විකුණුම් මිල මත 20% ක් ද දළ ලාභයක් සහිතව ලකුණු කරනු ලබයි.

අවශ්‍ය වන්නේ,

1. දැනට ගණනය කර ඇති පොදු කාර්ය පිරිවැය ද සහිතව විභජන පදනම පැහැදිලිව දක්වමින් පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

2. එක් එක් නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන සඳහා නිවැරදි පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය

3. 'A' සහ 'B' භාණ්ඩ වල ඒකක පිරිවැය

4. 'A' සහ 'B' භාණ්ඩ වල විකුණුම් මිල

(ලකුණු 25)

(මුළු ලකුණු 40)

(03)

(අ) අමන්දා ව්‍යාපාරය ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. මෙම ව්‍යාපාරයේ 2025.03.01 දිනට ආරම්භක ශේෂයන් හා 2025 මාර්තු මාසය තුළ සිදුකරන ලද ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයක ආකාරයෙන් පහත දක්වා ඇත.

රු.000

ශේෂය / ගනුදෙනු අංකය	වත්කම්					වගකීම්		හිමිකම
	ලී බඩු හා සවිකිරීම්	ලිපි ද්‍රව්‍ය තොගය	වෙළඳ ණයගැතියෝ	ගොඩනැගිලි කුලී අත්තිකාරම්	මුදල්	වෙළඳ ණයහිමියෝ	බැංකු ණය	ප්‍රාග්ධනය
ආරම්භක ශේෂය	800	350	170	480	1200	300	900	1800
1	200				-200			
2		600			-600			
3		-200	300					100
4		20	-30					-10
5			-170		160			-10
6					-100			-100
7		130				130		
8		-30				-30		
9					-180	-200		20
10					-110		-100	-10
11								-20 20
12		-50						-50
13		-300			450			150
14				-40				-40
15	-10							-10
අවසාන ශේෂය	990	520	270	440	620	200	800	1840

අතිරේක තොරතුරු

මාර්තු මාසය තුළ පහත ගනුදෙනු හා සිද්ධීන් සිදුවී ඇති නමුත් ඒවා ගිණුම්ගත වී නැත.

1) අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනයට ව්‍යාපාරයේ රු.180 000 ක් වටිනා තොග ගෙන ගොස් ඇත. (අයිතිකරු සිදුකළ එකම ගැනිලි අවස්ථාව මෙය පමණි.)

2) බොල් ණය කපා හැරීම් 30 000 ක් පොත් වල සටහන් කර නැත.

3) 2025 මාර්තු මාසයට අදාළ බැංකු ප්‍රකාශනයෙන් උපුටා ගත් තොරතුරුපහත දැක්වේ.

1.	බැංකුව අයකළ බැංකු ගාස්තු	15 000
2.	ස්ථාවර නියෝග ලෙස ගෙවූ රක්ෂණ ගාස්තු	160 000
3.	ණයගැති ප්‍රේෂණ ලැබීම්	100 000
4.	ලාභාංශ ආදායම් ලැබීම්	250 000

4) මෙම මාසයේ සිට අවසාන ණයගැති ශේෂය මත 10% ක අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කිරීමට ව්‍යාපාරය තීරණය කර ඇත.

අවශ්‍ය වන්නේ,

1) ඉහත අංක 1-15 දක්වා ඇති වටිනාකම් තුළින් නිරූපණය කෙරෙන ගනුදෙනු (අගයන්ද සහිතව) ලිවීම.

2) 2025 මාර්තු මාසය සඳහා ආදායම් ප්‍රකාශනය

3) 2025.03.31 දිනට

i) මුදල් ශේෂය රු......................... i) ණයගැති ශුද්ධ වටිනාකම රු.......................

(ලකුණු 30)

(ආ) රිද්මගේ ව්‍යාපාරයේ 2025.03.31 න් අවසන් වර්ෂයට අදාළව පිළියෙල කළ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන වලට අනුව ශුද්ධ ලාභය රු. 485 000 කි.

පසුව කරන ලද ගිණුම් පරීක්ෂාවේදී පහත වැරදීම් හා මග හැරීම් සිදුවී ඇති බවට අනාවරණය විය.

1. රු. 12 000 ක බැර පතක් පොත්වලින් මග හැරීම.
2. විදුලි බිල ගෙවීම් රු.85 000 ක් රු.58 000 ක් ලෙස විදුලි ගාස්තු ගිණුමට සටහන් වීම.
3. බොල්ණය කපාහැරීම් රු. 100 000 ක් බොල්ණය ගිණුමට මෙන්ම ණයගැති පාලන ගිණුමටද හර කර තිබීම.
4. රාධාගෙන් ණයට ගත් රු. 250 000 ක භාණ්ඩ තොගයක් ගැනුම් ජ'නලයට නිවැරදිව ඇතුළත් වූවත් රාධාගේ ගිණුමේ හර පැත්තට සටහන් කිරීම.
5. ලද කොමිස් රු. 80 000 ක් අදාළ ගිණුම් දෙකෙහිම හරට සටහන් වීම.
6. 2025.01.01 දින රු. 200 000 ක උපකරණ මිලදී ගැනීම් ගැනුම් ගිනුමෙහි සටහන් කිරීම. මෙම ආයතනය ලිබඩු උපකරණ පිරිවැය මත වාර්ෂිකව 12% ක් ක්ෂය කරයි.

අවශ්‍ය වන්නේ,

1. ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන්
2. ලාභය සංශෝධනය කිරීමේ ලේඛණය

(ලකුණු 10)
(මුළු ලකුණු 40)

04.

(අ) සීමිත සුමල් පොදු සමාගම වෙළෙඳ ව්‍යාපාරයක් වන අතර එය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. සමාගම භාණ්ඩ මිලදී ගැනීම සහ විකිණීම මුදලට සහ ණයට යන දෙයාකාරයටම සිදුකරනු ලබයි. 2025.03.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත තොරතුරු ව්‍යාපාරයේ ණයගැති සහ ණයහිමි ලෙජරයන්ගෙන් උපුටාගන්නා ලදී.

2025.03.31 දිනට ණයගැති ලෙජරය (රු’ 000)

විස්තරය	විමල් ට්‍රේඩර්ස්	නිමල් ට්‍රේඩර්ස්	කමල් ට්‍රේඩර්ස්	එකතුව
2024.04.01 දිනට ශේෂය	200	100	50	350
විකුණුම් (18% ක VATසහිතව)	118	-	236	354
මුදල් ලැබීම්	(150)	(45)	(200)	(395)
දුන් වට්ටම්	(10)	(5)	-	(15)
2025.03.31 ශේෂය	158	50	86	294

2025.03.31 දිනට ණයහිමි ලෙජරය (රු’ 000)

විස්තරය	පෙරේරා ට්‍රේඩර්ස්	ලිවේරා ට්‍රේඩර්ස්	සිල්වා ට්‍රේඩර්ස්	එකතුව
2024.04.01 දිනට ශේෂය	150	250	350	750
ගැනුම් (18% ක VATසහිතව)	59	177	295	531
මුදල් ගෙවීම්	(60)	(120)	(200)	(380)
ලද වට්ටම්	-	(20)	(10)	(30)
අවසන් ශේෂය	149	287	435	871

2025.03.31 දිනට ණයගැති සහ ණයහිමි ශේෂ ලැයිස්තුවල එකතුන් අදාළ පාලන ගිණුම්වල එදිනට ශේෂ සමග සමාන විය.

2025.03.01 දිනට මුදල් ගිණුමේ ශේෂය හර රු.75 000ක් සහ VAT පාලන ගිණුමේ බැර ශේෂය රු. 45 000ක් විය. ණයගැති සහ ණය හිමි ලෙජරවල ඇතුලත් මුදල් ගනුදෙනුවලට අමතරව පහත මුදල් ගනුදෙනු 2025 මාර්තු මාසයේ සිදුවිය.

- සමාගමේ මුදලට විකුණුම් රු.1 416 000 ක් විය. (18% ක VAT සහිතව)
- සමාගමේ මුදලට ගැනුම් රු. 590 000 ක් විය. (18% ක VAT සහිතව)
- සමාගම රු.236 000ක මුදලක් ගෙවා නව යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී (18% ක VAT සහිතව)
- රු.59 000 වෙනත් වියදම් ගෙවන ලදී (18% ක VAT සහිතව)

අවශ්‍ය වන්නේ,

2025.03.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත දක්වා ඇති ජ´නලයන් හා ගිණුම්

i. ගැනුම් ජර්නලය

ii. විකුණුම් ජර්නලය

iii. මුදල් ලැබීම් ජර්නලය

iv. මුදල් ගෙවීම් ජර්නලය

v. මුදල් ගිණුම,ණයගැති පාලන ගිණුම,ණයහිමි පාලන ගිණුම, VAT පාලන ගිණුම

(ලකුණු 20)

`(ආ) සීමිත කමල් පොදු සමාගම අපනයන වෙළෙඳපොළ සඳහා ඇඟලුම් නිෂ්පාදනය කරනු ලබයි. ඉහළ යමින් පවතින ඉල්ලුම නිසා නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමේ අරමුණින් රෙදි කැපීම් දෙපාර්තමේන්තුව සඳහා නව තාක්ෂණයෙන් යුත් රෙදි කැපීම් යන්ත්‍රයක් මිලදී ගැනීමේ ව්‍යාපෘතියක් සමාගම සලකා බලමින් පවතී.

නව යන්ත්‍රයේ ඇස්තමේන්තුගත මිල රු. 2 000 000කි. එහි අපේක්ෂිත ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වර්ෂ 5ක් සහ රු.50 000ක් වේ. තවද නව යන්ත්‍රය මිලදී ගැනීමට පෙර පරීක්ෂා කිරීම සඳහා ඒ සම්බන්ධ විශේෂඥයකුගේ උපදේශන සේවාව රු.100 000 ගෙවා ලබා ගැනීමට සමාගම සැලසුම් කර ඇත. නව යන්ත්‍රය සැපයුම්කරුගේ පරිශ්‍රයේ සිට සමාගමේ ඇගලුම් කර්මාන්ත ශාලාවට ප්‍රවාහනය කර ස්ථාපනය කිරීම සඳහා රු.300 000 මුදලක් වැය වේ යැයි අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතියට අදාළ අනෙකුත් මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු පහත පරිදි වේ.

i. ව්‍යාපෘතිය ආරම්භයේ දී නව යන්ත්‍රයේ ඉහල කාර්යක්ෂමතාව නිසා අමතර අමුද්‍රව්‍ය තොගයක් ලබාගත යුතු අතර ඒ වෙනුවෙන් අතිරේක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව රු.400 000ක් වේ. එය ව්‍යාපෘතිය අවසානයේ දී අය කර ගත හැකිය.

ii. නව යන්ත්‍රයේ ඉහල කාර්යක්ෂමතාව නිසා මෙහෙයුම් වියදම් රු. 200 000 ක් වාර්ෂිකව අඩු වී විකුණුම් අයභාරය රු.500 000ක් වැඩි වේ යැයි අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10%ක් වන අතර එහි වට්ටම් සාධක පහත පරිදි වේ.

වසර	1	2	3	4	5
වට්ටම් සාධකය (ආසන්න දශමස්ථාන දෙකකට)	0.91	0.83	0.75	0.68	0.62

අවශ්‍ය වන්නේ ,

1) ව්‍යාපෘතියේ එක් එක් වර්ෂය සඳහා මුදල් ගලාඒම් සහ මුදල් ගලා යාම් ලේඛනය

2) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය (NPV)

3) ශුද්ධ වර්තමාන අගය පදනම්ව නව යන්ත්‍රය මිලදී ගත යුතුද/ නැද්ද යන නිර්දේශය

(ලකුණු 10)

(ඉ) 2025 අප්‍රේල් මාසයේ පානීය ජලය බෝතල් කිරීමේ නිරත අරලිය එන්ටර්ප්‍රයිසස් නැමති තනි පුද්ගල ව්‍යාපාරයේ මුදලින් සිදු වූ ගනුදෙනු පිළිබඳ තොරතුරු පහත සපයා ඇත.

1. 2025 අප්‍රේල් 01 දින මුදල් ගිණුමේ ශේෂය රු.100 000 විය.
2. මාසය තුළ සිදුවූ අත්පිට විකුණුම් රු. 250 000ක් වූ අතර ණයට විකුණුම් රු.75 000ක් විය.
3. මාසය තුළ සිදුවූ අත්පිට ගැනුම් රු.150 000ක් වූ අතර ණයට ගැනුම් රු.100 000ක් විය.
4. මාසය තුළ සිදුවූ ණයට විකුණුම්වලට අදාළව ණයගැතියන්ගෙන් රු.50 000ක් ව්‍යාපාරයට චෙක්පත් මගින් ලැබී ඇත.
5. මාසය තුළ සිදුවූ ණයට ගැනුම් වෙනුවෙන් ණයහිමියන්ට රු. 80 000ක් චෙක්පත් මගින් ගෙවා ඇත.
6. ජල පෙරන යන්ත්‍රයේ මාසික නඩත්තු වියදම රු.15 000ක් චෙක්පත් මගින් ගෙවා ඇත.

පහත අතිරේක තොරතුරු 2025.05.03 වන දින ලබා ගන්නා ලද බැංකු ප්‍රකාශනයෙන් උපුටාගෙන ඇති අතර එම තොරතුරු ව්‍යාපාරයේ මුදල් ශේෂය ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන නොමැත.

1) ණය හිමියන්ට ගෙවූ රු. 20 000 ක චෙක්පත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් වී නොමැත.
2) ණය ගැතියන්ගෙන් ලද රු.15 000ක චෙක්පත් බැංකුවේ තැන්පත් කළ නමුත් නිෂ්කාෂණය වී නොමැත.
3) අප්‍රේල් මාසය සඳහා බැංකු ගාස්තු රු.5 000කි.
4) බැංකුවට කරන ලද ස්ථාවර නියෝග අනුව රු. 20 000ක බැංකු ණය වාරිකයක් වෙනත් බැංකුවකට සෘජුවම ප්‍රේෂණය කර ඇත.

අවශ්‍ය වන්නේ ,

1. 2025 අප්‍රේල් මාසය සඳහා මුදල් ගිණුම
2. 2025 අප්‍රේල් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය

(ලකුණු 10)
(මුළු ලකුණු 40)

5. (අ) අමායා, නිලු සහ විශ්මිගේ නිෂ්පාදන හවුල් ව්‍යාපාරයෙන් 2025.03.31 දිනට ශේෂ පිරික්සුමෙන් උපුටා ගැනීම් පහත පරිදි වේ.

		(රු 000)
2024.04.01 දිනට ප්‍රාග්ධන ශේෂ -	අමායා	8 000
	නිලු	7 000
ජංගම ශේෂ	- අමායා (හර)	300
	නිලු (බැර)	900
	නිලුගේ ණය	500
විශ්මි ව්‍යාපාරයට ගෙන ආ මුදල		5 000
විශ්මි ව්‍යාපාරයට ගෙන ආ අමුද්‍රව්‍ය		1 000
විකුණුම්		10 500
විකුණුම් පිරිවැය		6 200
මෙහෙයුම් වියදම්		2 010
විශ්මිගෙන් ලැබිය යුතු ගොඩනැගිලි කුලී		80
2025.01.01 දින ලබාගත් බැංකු ණය		1 000

අතිරේක තොරතුරු

(1) 2024.04.01 දින විශ්මි හවුල් ව්‍යාපාරයට බැඳුන අතර එදින ඇස්තමේන්තු කරන ලද කීර්තිනාමය රු. 1 800 000 කි. එය ප්‍රාග්ධන ගිණුම් තුලින් ගැළපිය යුතුය.

(2) විශ්මි බැඳීමට පෙර අමායා සහ නිලු සමානව ලාභාලාභ බෙදාගත් අතර නව ලාභාලාභ අනුපාතය අමායා, නිලු සහ විශ්මි අතර පිළිවෙලින් 2:2:1 වේ.

(3) පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ශේෂ මත එකඟ වී ඇති ප්‍රාග්ධන පොළි වාර්ෂිකව 6 % කි. විශ්මිට වාර්ෂික හවුල් වේතන ලෙස රු. 600 000 ක් හිමි වේ.

(4) හවුල් කරුවන් ව්‍යාපාරයට සපයන ණය සඳහා වාර්ෂික පොළිය 8% ක් වන අතර බැංකු ණය සඳහා වාර්ෂික පොළිය 16% කි. නිලු ව්‍යාපාරයට සපයා ඇති රු.500 000 ක ණය, 2024.10.01 දින සිට ඇය යෙදූ ප්‍රාග්ධනයක් ලෙස සැලකීමට හවුල්කරුවන් එකඟ වී ඇත.

(5) වර්ෂය තුල විශ්මිට ගෙවූ වේතන 300 000 ක් වැරදීමකින් නිෂ්පාදන සුපරීක්ෂක වේතන තුල ඇතුළත්ව ඇත. ව්‍යාපාරය නිපදවන භාණ්ඩ පමණක් අලෙවි කරන අතර 2025.03.31 දින වන විට වර්ෂය තුළ නිෂ්පාදනය කළ තොගයෙන් 1/10 ක් ඉතිරිව තිබුණි.

(6) වර්ෂය තුළ ව්‍යාපාරයේ විකුණුම් සේවක වැටුප් රු. 100 000 ක් අමායා සිය පෞද්ගලික මුදලින් ගෙවා ඇති අතර අමායා සහ නිලු රු. 120 000 බැගින් මුදල් ගැනිලි ලෙස ලබා ගෙන ඇත.

(7) 2024.12.01 දින සිට විශ්මි ව්‍යාපාරයේ ගොඩනැගිලි කොටසක් මාසිකව රු. 20 000 ක කුලියකට ඇස්තමේන්තු කර ලබාගෙන ඇති අතර එම කුලිය මෙහෙයුම් වියදම් වලින් අඩු කර, ලැබිය යුතු ගොඩනැගිලි කුලී ගිණුමට හර කර ඇත.

අවශ්‍ය වන්නේ,

(1) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල් කරුවන්ට කරන ලද විසර්ජනයන්ද ඇතුළුව)

(2) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්

(ලකුණු 25)

(ආ) ක්‍රීඩා සංගමයක් සිය අරමුදල් තර කර ගැනීම සඳහා ගංගාවක බෝට්ටු සංචාර වැඩ සටහනක් සැළසුම් කරයි. බෝට්ටු සංචාරය දින දෙකක් පැවැත්වීමට බලාපොරොත්තු වන අතර එක් දිනකදී 100 දෙනෙකු සහභාගී කර ගත හැකි බවත් දිනකට බෝට්ටු දෙකක් යොදා ගැනීමටත් සැළසුම් කර ඇත.

ඒ සඳහා ඇස්තමේන්තු කරන ලද පිරිවැය පහත දැක්වේ.	(රු.)
එක් බෝට්ටුවක් සඳහා (පදවන්නෙකු සමඟ) දිනක ගාස්තුව	38 000
එක් බෝට්ටුවක් එක් දිනක් ධාවනය සඳහා ඉන්ධන පිරිවැය	17 000
ජීවිතාරක්ෂක කිමිදුම් කරුවන්ට එක් සංචාරයෙකු සඳහා ගෙවිය යුතු ගාස්තුව	200
ප්‍රචාරණ පිරිවැය	10 000
ජීවිතාරක්ෂක කබා කුලියට ගැනීමේ පිරිවැය	4 000

- පැයක පමණ එක් බෝට්ටු සංචාරයක් සඳහා සංචාරකයෙකුගෙන් රු. 2 000 ක ගාස්තුවක් අය කිරීමට සැළසුම් කර ඇත.

අවශ්‍ය වන්නේ,

1. එක් සංචාරකයෙකු සඳහා දායකය
2. වැඩ සටහනෙහි මුළු ස්ථාවර පිරිවැය
3. මුළු පිරිවැය ආවරණය කර ගැනීම සඳහා දින දෙකෙහිදීම සහභාගී විය යුතු සංචාරකයින් ගණන
4. වැඩ සටහනෙන් රු. 90 000 ක අතිරික්තයක් ලැබීම සඳහා ලාභ හෝ අලාභ නොලබන මට්ටමට වඩා වැඩියෙන් සහභාගී විය යුතු සංචාරකයින් ගණන
5. රු. 10 000 ක අතිරේක ප්‍රචාරණ වියදමක් දරන්නේ නම් සහ අපේක්ෂිත උපරිම සංචාරකයින් සංඛ්‍යාව සහභාගී කර ගත හැකි නම්, රු. 180 000 ක අතිරික්තයක් ලැබීම සඳහා එක් සංචාරකයෙකුගෙන් අයකළ යුතු ගාස්තුව

(ලකුණු 15)

(මුළු ලකුණු 40)

6. (අ) සීමිත උදාර පොදු සමාගමේ 2025.03.31 දිනට සහ 2024.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන වලින් පහත තොරතුරු උපුටාගෙන ඇත.

	2025.03.31 (රු.000)	2024.03.31 (රු.000)
දේපළ පිරියත හා උපකරණ (ධාරණ අගය)	22 500	18 300
වෙළෙඳ ලැබිය යුතු දෑ	1 880	1 220
මුදල් හා මුදල් සමාන දෑ	2 425	520
ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමන්‍ය කොටස්	35 000	25 000
ප්‍රත්‍යාගණන සංචිතය (ඉඩම්)	8 000	-
රඳවාගත් ඉපැයුම්	200	2 100
වෙළෙඳ ගෙවිය යුතු දෑ	1 975	1 080
උපචිත මෙහෙයුම් වියදම්	1 600	960
උපචිත පොළී	500	-
ආදායම් බදු වෙන් කිරීම	830	740

අතිරේක තොරතුරු

(1) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී වෙළෙඳ භාණ්ඩ විකුණුම් සහ ගැනුම් පිළිවෙළින් රු . 26 000 000 ක් හා රු. 19 500 000 කි. මුළු විකුණුම් වලින් 25% ක් ණයට විකුණුම් වන අතර මුළු ගැනුම් වලින් 40% ක් ණයට ගැනුම් වේ.

(2) වෙළෙඳ ණය අයකර ගැනීමේදී රු. 290 000 ක් වට්ටම් දි ඇති අතර වෙළෙඳ ණය ගෙවීමේදී රු. 330 000 ක් වට්ටම් ලැබී ඇත.

(3) වර්ෂයට අදාළ මෙහෙයුම් වියදම් රු. 8 500 000 ක් හා ආදායම් බදු වියදම රු. 1 950 000 කි. මෙහෙයුම් වියදම් තුල ඇතුලත් වාර්ෂික ක්ෂය වටිනාකම රු. 3 400 000 කි.

(4) වර්ෂයට අදාළ පොළී වියදමෙන් අඩක් සහ 2024.03.31 දින තිබූ දිගුකාලීන ණය මුදලෙන් රු. 2 000 000 ක් වර්ෂය තුළදී ගෙවා ඇත.

(5) රඳවාගත් ඉපැයුම් උපයෝගී කරගෙන රු. 4 000 000ක සාමාන්‍ය කොටස් වර්ෂය තුළදී නිකුත් කර ඇති අතර ඉතිරි සාමාන්‍ය කොටස් නිකුත් කිරීම් වලින් සම්පූර්ණ මුදල් ලබාගෙන ඇත. වර්ෂය තුළදී ලාභාංශ ගෙවීමක් සිදු කර ඇත.

(6) ඉඩම් ප්‍රථම වතාවට ප්‍රවර්තන වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කිරීමෙන් ලද අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිත වලින් දැක්වේ. කාලපේදයේ මුළු විස්තීර්ණ ආදායම රු. 12 600 000 කි.

(7) වර්ෂය තුළදී රු. 75 000 000ක ලී බඩු හා උපකරණ මිලට ගෙන ඇති අතර ව්‍යාපාරයේ ප්‍රයෝජනයට තිබූ වෙනත් උපකරණ විකිණීමෙන් රු. 50 000 ක ලාභයක් ලැබී ඇත.

අවශ්‍ය වන්නේ,

“L K A S 7- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය” ප්‍රමිතයට අනුව 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිටින උදාර පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය සඳහා ඍජු ක්‍රමය භාවිත කරන්න)

(ලකුණු 20 යි)

(ආ) 2025.03.31 සහ 2024.03.31 යන වර්ෂයන්ට අදාළව සමාගමක් ගණනය කර ඇති අනුපාත පහත දැක්වේ.

	2025.03.31	2024.03.31
ශුද්ධ ලාභ අනුපාතය	20%	28%
ජංගම අනුපාතය	1.95:1	1.2:1
ණයගැති පිරිවැටුම් අනුපාතය	වාර 12	වාර 08
ණය අනුපාතය	28%	40%
පොළී ආවරණ අනුපාතය	වාර 06	වාර 09

අතිරේක තොරතුරු

1. වර්ෂය තුල මුළු විකුණුම් රු. 30 000 000 ක් වන අතර මුළු විකුණුම් වලින් 80% ක් ණයට විකුණුම් වේ.
2. 2024.04.01 දිනට වෙළෙඳ ලැබිය යුතු ශේෂය රු. 2 100 000 කි.
3. කාලපේදයේ පොළී වියදම රු. 1 600 000 ක් වේ.
4. ජංගම වගකීම් රු. 4 100 000 කි.
5. දිගු කාලින ණය රු. 7 000 000 කි.

අවශ්‍ය වන්නේ

(1.) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත වටිනාකම්

I. කාලපේදයේ ලාභය
II. ආදයම් බදු වියදම
III. 2025.03.31 දිනට වෙළෙඳ ලැබිය යුතු දෑ
IV. 2025.03.31 දිනට ජංගම වත්කම්
V. 2025.03.31 දිනට මුළු හිමිකම

(2.) 2024.03.31 දිනෙන් අවසන් වර්ෂයට වඩා 2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේදී ව්‍යාපාරය සාර්ථකද අසාර්ථකද යන්න ඉහත කරුණු වලට අදාල ව දක්වන්න.

		සාර්ථකද / අසාර්ථකද
I.	ශුද්ධ ලාභය	....
II.	කෙටිකාලීන ද්‍රවශීලතාවය	....
III.	වෙළෙඳ ණය එකතු කිරීමේ කාර්යක්ෂමතාව	....
IV.	තෝලන මට්ටම	....
V.	ණය පොළී ගෙවීම	....

(ලකුණු 10 යි)

(ඉ) ලක්දිව කර්මාන්ත ශාලාවේ කම්කරු සුභසාධක සංගමයේ මූල්‍ය ප්‍රකාශන වලින් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආපන ශාලාවේ ආදායම් ප්‍රකාශනය රු.000

විකුණුම්	1 820
විකුණුම් පිරිවැය	(900)
දළ ලාභය	920
වියදම්	
විදුලි ගාස්තු	(130)
ක්ෂය වියදම	(80)
වැටුප්	(600)
ආපනශාලා වෙනත් වියදම්	(50)
වර්ෂය සඳහා ලාභය	60

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සුභ සාධක සංගමයේ ආදායම් ප්‍රකාශනය රු. 000

ආදායම්	
සාමාජික මුදල්	700
මෝටර් රථ පරිත්‍යාග	350
ආපනශාලා ලාභය	60
වියදම්	**1 110**
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය වියදම්	(120)
විදුලි ගාස්තු	(30)
ක්ෂය වියදම	(210)
කපා හරින ලද සමාජික මුදල්	(15)
සංගමයේ වෙනත් වියදම්	(40)
අතිරික්තය	**695**

ආරම්භක සහ අවසාන මූල්‍ය තත්ත්ව ප්‍රකාශන වලින් උපුටාගත් තොරතුරු.

	2025.03.31	2024.04.01
	රු. 000	රු.000
දේපළ පිරියත හා උපකරණ (ධාරණ අගය)	5 220	1 800
ආපනශාලා තොගය	80	160
ලැබිය යුතු සාමාජික මුදල්	27	22
මුදල් හා මුදල් සමාන දෑ	750	308
ආපනශාලා ණය හිමියෝ	92	160
කළින් ලද සාමාජික මුදල්	15	5

අතිරේක තොරතුරු

1. කාලපේදය තුල දේපළ පිරියත හා උපකරණ විකුණා හෝ ඉවත් කර නොමැති අතර ආපනශාලා උපකරණ මිලට ගෙන ඇත.
2. 2024.04.01 දින පරිත්‍යාග ලෙස ලද මෝටර් රථය වර්ෂ 10 ක් පුරා සමානව ආදායම් ලෙස හඳුනා ගනී.

<u>අවශ්‍ය වන්නේ,</u>

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සුභසාධක සංගමයේ මුදල් ගිණුම.

(ලකුණු 10)

(මුළු ලකුණු 40)

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

General Certificate of Education (Adv. Level) Examination

උත්තර පත්‍රය

Answer Sheet – 2025

ගිණුම්කරණය I

Accounting I

ප්‍රශ්න අංකය	පිළිතුරු
1	3
2	4
3	3
4	3
5	4
6	1
7	4
8	4
9	4
10	4
11	2
12	5
13	2
14	2
15	2
16	4
17	2
18	1
19	2
20	4
21	3
22	1
23	2
24	5

25 3

26 4

27 4

28 3

29 4

30 5

31 A - ණය සපයන්නන්ට, අනෙකුත් ණය හිමියන්ට

B - සම්පත් සැපයීම, මූල්‍ය

32

ගනුදෙනු අංකය	වගකීම්		හිමිකම්	
	අඩුවේද වැඩිවේද	වටිනාකම රු.	අඩුවේද වැඩිවේද	වටිනාකම රු.
(1)	අඩුවේ	100 000	වැඩිවේ	80 000
(2)	අඩුවේ	50 000	අඩුවේ	175 000

33 රු. 961 000

34 රු. 107 000 කින් වැඩිවේ

35

	අයිතමය	සංරචකය
A	නොඉපයූ ආදායම්	මූල්‍ය තත්ව ප්‍රකාශනය
B	ගෙවූ ආදායම් බදු	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
C	පොදු සංචිතයට මාරු කිරීම	හිමිකම වෙනස් වීමේ ප්‍රකාශනය
D	ගොඩනැගිලි පළමු වර ප්‍රත්‍යාගණන ඌනතාවය	ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

36 (1) සත්‍ය

(2) අසත්‍ය

(3) සත්‍ය

(4) සත්‍ය

37 (A) ආරක්ෂණ

(B) ගැලපුම්

(C) ඒකක

(D) අනාවරණ

38 A. රු. 4 800 000

B. රු. 1 500 000

39 (අ) රු. 1 200 000

(ආ) රු. 4 100 000

40 (අ) රු. 5 000 000

(ආ) රු. 900 000

41 A අදාළ බව

B ආර්ථික සම්පත් (වත්කම්)

C අඛණ්ඩ පැවැත්ම

D කාලීන බව

42 A ප්‍රතිපත්ති

B ප්‍රතිපත්ති

C ඇස්තමේන්තු

D ඇස්තමේන්තු

43 A රු.1 250 000

B වර්ෂ 05

C රු.62 500

44 A රු. 1 000 000

B රු. 400 000

45

	අවස්ථාව	ප්‍රතිපාදන/අසම්භාව්‍ය වගකීම්/ අසම්භාව්‍ය වත්කම්	හේතුව
45	A	අසම්භාව්‍ය වගකීම්	ගෙවිය යුතු වටිනාකම විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ නොහැක.(විය හැකි බැඳීමක් පවතින බැවිනි)
	B	අසම්භාව්‍ය වත්කම්	වන්දි ලැබීමේ සම්භාවිතාව වැඩි බැවින්

46 (1) සත්‍ය

(2) අසත්‍ය

(3) අසත්‍ය

(4) අසත්‍ය

47 (1) පැයකට රු. 30

(2) රු.465

48	(1) ඒකක 16 000 (2) ඒකක 15 500	(2) ඒකක 10 000 (4) ඒකක 12750 හෝ 10150
49	(1) ඒකක 225	(2) ඒකක 345
50	(1) රු. 618 000 (2) රු. 430 000	

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

General Certificate of Education (Adv. Level) Examination

උත්තර පත්‍රය

Answer Sheet – 2025

ගිණුම්කරණය II

Accounting II

1.ප්‍රශ්න අංක 01 පිළිතුරු

(1)

සීමිත දිලන පොදු සමාගම

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය (01)

	සටහන්	රු.000	
විකුණුම්	02	74 400	(පෙරවැඩ 01)
විකුණුම් පිරිවැය	01	(34 800)	(පෙරවැඩ 02)
දළ ලාභය		39 600	
වෙනත් ආදායම්	01	80	(පෙරවැඩ 03)
බෙදාහැරීමේ පිරිවැය	03	(14 570)	(පෙරවැඩ 04)
පරිපාලන වියදම්	04	(12 123)	(පෙරවැඩ 05)
වෙනත් වියදම්	02	(2 100)	(පෙරවැඩ 06)
මූල්‍ය වියදම්	01	(1 600)	(පෙරවැඩ 07)
බදු පෙර ලාභය	01	9 287	
ආදායම් බදු වියදම	01	(2 150)	(පෙරවැඩ 08)
කාලච්ඡේදයේ ලාභය		7 137	
වෙනත් විස්තීරණ ආදායම්			
ඉඩම් ප්‍රත්‍යාගණන සංචිතයෙහි වෙනස් වීම	01	(1 500)	
කාලච්ඡේදය සඳහා මුළු විස්තීරණ ආදායම	01	5 637	

සටහන් 01 බදු පෙර ලාභය ගණනය කිරීමේදී පහත වියදම් ද අඩුකර ඇත.

	රු.000	
අධ්‍යක්ෂ වේතන	800	
විගණන ගාස්තු	500	අයිතම දෙකකට 01 බැගින්
ක්ෂය	4 693	ලකුණු 02
ඉඩම් ප්‍රත්‍යාගණන ඌනතාවය	500	
වගකීම් සහතික වියදම	700	
තොග කපා හැරීම	100	
කල්බදු පොලී	600	(ලකුණු 20)

පෙරවැඩ 01

	රු.000	
විකුණුම්	88 500	
VAT	(13 500)	01
නොඉපයූ ආදායම්	(600)	01
	74 400	

පෙරවැඩ 02

විකුණුම් පිරිවැය	43 000	
VAT	(8 200)	01
	34 800	

පෙරවැඩ 03 (වෙනත් ආදායම්)

මෝටර් රථ විකිණීමේ ලාභය	80	01

පෙරවැඩ 04 බෙදාහැරීමේ පිරිවැය

ශේෂය	14 000	
බොල්ණය	500	01
මෝටර් රථ ක්ෂය	(180)	01
ගෙවූ වගකීම් සහතික වියදම්	(450)	01
වගකීම් සහතික වියදම	700	
	14 570	

පෙරවැඩ 07 මූල්‍ය පිරිවැය

ශේෂය	1 000	
කල්බදු පොලී	600	01
	1 600	

පෙරවැඩ 08 ආදායම් බදු වියදම

ගෙවූ බදු	1 500	
ගෙවිය යුතු බදු	750	
ඇස්තමේන්තු බදු	2 250	
පෙර වර්ෂයේ අධි වෙන්කිරීම්	100	01
ආදායම් බදු වියදම	2 150	

පෙරවැඩ 05 පරිපාලන වියදම්

ශේෂය	13 500	
කාර්යාල උපකරණ ක්ෂය	(177)	01
භාවිත අයිතිය සහිත වත්කම් ක්ෂය	500	01
ගෙවූ අතුරු ලාභාංශ	(1 800)	01
උපචිත විගණන ගාස්තු	100	01
	12 123	

පෙරවැඩ 06 වෙනත් වියදම්

ශේෂය	1 500	
තොග කපා හැරීම	100	01
ඉඩම් ප්‍රත්‍යාගණන ඌනතාවය	500	01
	2 100	

(2) සීමිත දිලන පොදු සමාගම 2025.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය 01

ජංගම නොවන වත්කම්	සටහන්	රු.000	
දේපළ පිරියත හා උපකරණ	02	64 007	
භාවිත අයිතිය සහිත වත්කම්	03	4 500	
ජංගම වත්කම්			
තොගය		4 700	පෙරවැඩ 09
වෙළෙඳ ණයගැතියෝ		15 500	
මුදල් හා මුදල් සමාන දෑ		2 300	
මුළු වත්කම්		91 007	
හිමිකම			
ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස්		45 000	
ප්‍රත්‍යාගණන සංචිතය		1 500	
රඳවාගත් ඉපයුම්		21 687	
ජංගම නොවන වගකීම්			
කල්බදු වගකීම්		2 710	පෙරවැඩ 10
ජංගම වගකීම්			
වෙළෙඳ ණය හිමියෝ		11 000	
කල්බදු වගකීම		1 890	පෙරවැඩ 10
වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන		650	පෙරවැඩ 11
ගෙවිය යුතු ආදායම් බදු		750	
නොඉපයූ ආදායම්		600	
උපචිත විගණන ගාස්තු		100	
ගෙවිය යුතු VAT		5 120	
මුළු හිමිකම් හා වගකීම්		91 007	

(ලකුණු 17)

සටහන 02 - දේපළ පිරියත හා උපකරණ

පිරිවැය / අගය	ඉඩම්	ගොඩනැගිලි	මෝටර් රථ	කාර්යාල.උප	එකතුව
2024.04.01 දිනට ශේෂය	40 000	25 000	15 000	8 820	88 820
ඉඩම් ප්‍රත්‍යාගණන ඌනතාවය	(2 000)				(2 000)
එකතු කිරීම්				1 000	1 000
ඉවත්කිරීම්			(3 000)		(3 000)
2025.03.31 දිනට ශේෂය	38 000	25 000	12 000	9 820	84 820
<u>සමුච්චිත ක්ෂය</u>					
2024.04.01 දිනට ශේෂය	-	8 000	7 200	2 500	18 700
කාලච්ඡේදයේ ක්ෂය	-	1 250	1 620	1 323	3 193
විකිණීම මත ඉවත්කළ ක්ෂය			(1 080)		(1 080)
2025.03.31 දිනට ශේෂ		9 250	7 740	3 823	20 893
2025.03.31 දිනට ධාරණ අගය	38 000	15 750	4 260	5 997	64 007

භාවිත අයිතිය සහිත වත්කම් - සටහන් 03

<u>පිරිවැය</u>	
2024.04.01 දිනට ශේෂය	-
එකතු කිරීම්	5 000
2025.03.31 දිනට ශේෂය	5 000
<u>සමුච්චිත ක්ෂය</u>	
2024.04.01 දිනට ශේෂය	-
කාලච්ඡේදයේ ක්ෂය	500
2025.03.31 දිනට ශේෂය	500
2025.03.31 දිනට ධාරණ අගය	4 500

පෙරවැඩ 09 තොගය රු.000

තොග පිරිවැය	2 800
තොග කපාහැරීම්	(100)
	2 700

පෙරවැඩ 12 VAT

විකුණුම් මත VAT	13 500
ගැනුම් මත VAT	(8 500)
ඡායා පිටපත් යන්ත්‍රය මත VAT	(180)
ගෙවිය යුතු VAT	5 120

පෙරවැඩ 10 කල්බදු ණය රු.000

ණය ශේෂය	4 000
ණය පොළිය	600
මුළු ණය	4 600

4 600 →
ජංගම 1 200 + (1 200 -510) = 1 890
ජංගම නොවන 4 600 - 1 890 = 2 710

පෙරවැඩ 11 වගකීම් සහතික ප්‍රතිපාදන

2024.04.01 දිනට ශේෂය	(400)
වර්ෂය තුළ ගෙවීම්	450
2024.03.31 ශේෂය	650
වගකීම් සහතික සඳහා වියදම	700

03.

සීමිත දිලන පොදු සමාගම

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය රු.000

	ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස්	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපයුම්	එකතුව
2024.04.01 ශේෂ	45 000	3 000	16 350	64 350
මුළු විස්තීරණ ආදායම		(1 500)	7 137	5 637
අතුරු ලාභාංශ			(1 800)	(1 800)
2025. 03.31 ශේෂ	45 000	1 500	21 687	68 187

(ලකුණු 03)

ප්‍රශ්න අංක 02 පිළිතුරු

(1) වැටුප් ලේඛනය

වැටුප් ලේඛනය											
සේවක අංකය	**මූලික වැටුප**	**අතිකාල දීමනාව**	**ජීවන වියදම් දීමනාව**	දළ වැටුප	**EPF 10%**	**සුබ සා. ගාස්තු**	**වැටුප් අත්ති.**	**මුළු අඩු කිරීම**	**ශුද්ධ වැටුප**	**EPF 15%**	**ETF 3%**
1	80 000	15 000	20 000	115 000	8 000	2 000	50 000	60 000	55 000	12 000	2 400
2	72 000	18 000	20 000	110 000	7 200	2 000	-	9 200	100 800	10 800	2 160
3	64 000	4 000	20 000	88 000	6 400	2 000	25 000	33 400	54 600	9 600	1 920
	216 000	**37 000**	**60 000**	**313 000**	**21 600**	**6 000**	**75 000**	**102 600**	**210 400**	**32 400**	**6 480**
	01	01		01			01		01	01	01

(ලකුණු 07)

(2)

වැටුප් පාලන ගිණුම - මාර්තු

ගෙවිය යුතු **EPF**	21 600	වැටුප් ගිණුම	313 000
සුබ සාධන	6 000		
අත්තිකාරම්	75 000		
ගෙවිය යුතු වැටුප්	210 400		
	313 0000		313 000

(2කට එක බැගින් උපරිම ලකුණු 02)

ගෙවිය යුතු වැටුප් ගිණුම - මාර්තු

මුදල් ගිණුම	300 000	ශේෂය ඉ/ගේ	300 000
		වැටුප් පලන	210 400
ශේෂය ප/ගේ	210 400		230 000
	510 400		510 400

(2කට එක බැගින් උපරිම ලකුණු 02)

ගෙවිය යුතු EPF ගිණුම - මාර්තු

මුදල්	60 000	ශේෂය ඉ/ගේ	60 000
		වැටුප් පාලන	21 600
		EPF වියදම්	32 400
ශේෂය ප/ගේ	54 000		
	114 000		114 000

(2කට එක බැගින් උපරිම ලකුණු 02)

(3) වැටුප් සම්බන්ධ මුළු වියදම

දළ වැටුප	313 000
EPF වියදම	32 400
ETF වියදම	6 480
	351 880

(ලකුණු 02) (මුළු ලකුණු 15)

ආ)

(1) පොදු කාර්ය විභජන පත්‍රිකාව

අයිතමය	පදනම	වටිනාකම	එකලස්	නිමවුම්	ගබඩාව
බෙදාහරින ලද	සෘජු	690 000	450 000	240 000	
වක්‍ර ද්‍රව්‍ය	සෘජු	280 000	186 000	94 000	
කුලිය	භූමි ප්‍රමාණය	600 000	300 000	200 000	100 000
විදුලිය	කිලෝ වොට්	450 000	180 000	150 000	120 000
යන්ත්‍ර ක්ෂය	යන්ත්‍ර පිරිවැය	700 000	500 000	200 000	
ගබඩා වැටුප	සෘජු	90 000			90 000
වක්‍ර වැටුප	සේවක සංඛ්‍යාය	540 000	300 000	160 000	80 000
		3 350 000	1 916 000	1 044 000	390 000
			234 000	156 000	-390 000
			2 150 000	1 200 000	

(2)

පොදු. පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

එකලස් = $\frac{\text{අයවැය ගත පොදු කාර්ය පිරිවැය}}{\text{අයවැය ගත යන්ත්‍ර පැය}}$

$\frac{2\ 150\ 000}{10\ 000}$

පැයකට රු. 215

නිමැවුම් = $\frac{\text{අයවැය ගත පොදු කාර්ය පිරිවැය}}{\text{අයවැය ගත ශ්‍රම පැය}}$

$\frac{2\ 100\ 000}{8\ 000}$

පැයකට රු. 150

(3) භාණ්ඩවල ඒකකයක පිරිවැය

		A		B
සෘජු ද්‍රව්‍ය පිරිවැය		800		500
සෘජු ශ්‍රමය		335		370
නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය				
එකලස්	215*3	645	215*2	430
නිමවුම්	150*2	300	150*3	450
නිෂ්පාදන නොවන පිරිවැය		120		50
මුළු නිෂ්පාදන පිරිවැය		2 200		1 800

(4) ඒකක විකුණුම් මිල

	A	B
	2200*125/100	1800*100/80
	රු.2 750	රු. 2 250

(ලකුණු 08)

ප්‍රශ්න අංක 03 පිළිතුරු

1)

1. රු 200 000 වටිනා ලී බඩු සවි කිරීම් අත්පිට මුදලට ගැනීම.
2. අත්පිට මුදලට භාණ්ඩ ගැනුම් රු 600 000 කි.
3. රු 200 000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් 180 000 කට ණයට විකිණීම
4. භාණ්ඩ ආපසු එවුම් රු 30 000 කි. මෙහි පිරිවැය රු 20 000 කි.
5. ණය ගැතියන්ගෙන් ලද මුදල් රු 160 000 කි. දුන් වට්ටම රු 10 000 කි.
6. මෙහෙයුම් වියදම් ගෙවිවා රු 100 000.
7. ණයට භාණ්ඩ ගැනුම් රු 130 000 කි.
8. භාණ්ඩ ආපසු යැවුම් රු 30 000 කි.
9. රු 200 000 ක් වටිනා ණයහිමියන් රු 20 000 ක වට්ටම් යටතේ පියවීම.
10. බැංකු ණය වාරිකයක් ගෙවිවා රු 110 000 කි. එහි අඩංගු පොලිය රු 10 000 කි.
11. අයිතිකරු තම පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ වියදමක් ගෙවිවා රු 20 000 කි.
12. තොග පරිත්‍යාගරු 50 000 කි.
13. රු 300 000 ක් පිරිවැය වූ තොග රු 450 000 කට අත්පිට විකිණීම
14. මාර්තු මාසයට අදාළ රු 40 000 ක ගොඩනැගිලි කුලිය සටහන් කිරීම
15. ලී බඩු සවිකිරීම් ක්ෂය රු 10 000 කි.

(1කට 1බැගින් උපරිම ලකුණු 15)

(2)

අමන්දාගේ ව්‍යාපාරය 2025.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

විකුණුම් (300+450)		750
ආපසු එවුම්		(30)
<u>විකුණුම් පිරිවැය</u>		
මුල තොගය	350	
ගැනුම්	730	
ආපසු යැවුම්	-30	
තොග පරිත්‍යාග	-50	
ගැනිලි	-180	
අග තොගය	-340	-480
දළ ලාභය		**240**
වෙනත් ආදායම්		
ලද වට්ටම්	20	
ලාභාංශ	250	270
		510
වියදම්		
දුන්වට්ටම්	10	
මෙහෙයුම් වියදම්	120	
ණය පොලී	10	
විදුලිය	20	
පරිත්‍යාග	50	
ගොඩනැගිලි කුලී	40	
ලී බඩු ක්ෂය	10	
බොල්ණය	30	
බැංකු ගාස්තු	15	
රක්ෂණ	160	
අඩමාන ණය වෙන් කිරීම්	14	**(459)**
ලාභය		**<u>51</u>**

3)

1) මුදල් ශේෂය රු. 795 000

2) ණය ගැති ශේෂය රු. 126 000

පෙරවැඩ 01	රු. 000
වගුවෙහි මුදල් ශේෂය	620
බැංකු ගාස්තු	(15)
රක්ෂණ ගාස්තු	(160)
ණයගැති ප්‍රේෂණ	100
ලාභාංශ ආදායම්	250
මුදල් ශේෂය	795

පෙරවැඩ 02	
වගුවෙහි ණයගැති ශේෂය	270
බොල්ණය	(30)
ප්‍රේෂණ	(100)
ණය ගැති ශේෂය	140
අඩමාණ ණය වෙන් කිරීම	(14)
ණයගැති ශුද්ධ වටිනාකම	126

ආ) (1)

පොදු ජර්නලය.

1) ලාභ ලාභ ගිණුම හර ණයගැති පාලන ගිණුම (රු 12 000 ක බැරපතක් පොත් වලින් මග හැරීමේ වැරැද්ද නිවැරදි කිරීම)	12 000	12 000
2) ලාභ ලාභ ගිණුම හර අවිනිශ්චිත ගිණුම (විදුලි ගාස්තු ගෙවීම රු 85 000 ක් රු.58 000 ක් ලෙස සටහන් වීම නිවැරදි කිරීම)	27 000	27 000
3) අවිනිශ්චිත ගිණුම හර ණයගැති පාලන ගිණුම (බොල්ණය කපා හැරීම් රු.100 000 ක් බොල්ණය ගිණුමට මෙන්ම ණයගැති පාලන ගිණුමට ද හර කිරීම නිවැරදි කිරීම)	200 000	200 000
4) මෙය උප ලෙජර වැරැද්දකි. ජ´නල් සටහන් අවශ්‍ය නැත.		
5) අවිනිශ්චිත ගිණුම හර ලාභ ලාභ ගිණුම (ලද කොමිස් අදාළ ගිණුම් දෙකේම හර කිරීමේ වැරැද්ද නිවැරදි කිරීම)	160 000	160 000
6) (i) උපකරණ ගිණුම හර ලාභ ලාභ ගිණුම (උපකරණ මිලදී ගැනීම ගැනුම් ගිණුමට සටහන් කිරීම නිවැරදි කිරීම.)	200 000	200 000
(ii) ලාභ ලාභ ගිණුම හර උපකරණ සමුච්චිත ක්ෂය ගිණුම (උපකරණ ක්ෂය සටහන් කිරීම.)	6 000	6 000

(2)

ලාභය සංශෝධනය කිරීමේ ලේඛනය		රු. 000
කෙටුම්පත් ශුද්ධ ලාභය		485
+ ලද කොමිස්	160	
ගැනුම් අඩුවීම	200	360
		845
- ආපසු එවුම්	12	
විදුලි ගාස්තු අඩුවෙන් සටහන් වීම	27	
උපකරණ ක්ෂය	6	(45)
නිවැරදි ශුද්ධ ලාභය		800

ප්‍රශ්න අංක 04 පිළිතුරු

(අ) එක් එක් වර්ෂය සඳහා මුදල් ගලා ඒම් සහ ගලා යාම්

(1)

(රු.´000)

වර්ෂය	0	1	2	3	4	5
මූලික පිරිවැය	(2000)					
සුන්බුන් අගය						50
උපදේශන සේවා වියදම්	(100)					
ප්‍රවාහනය / ස්ථාපනය	(300)					
අතිරේක කාරක ප්‍රාග්ධනය	(400)					400
මෙහෙයුම් වියදම් අඩුවීම		200	200	200	200	200
විකුණුම් අයභාරය වැඩිවීම		500	500	500	500	500
ශුද්ධ මුදල් ප්‍රවාහ	**(2800)**	**700**	**700**	**700**	**700**	**1150**

ශුද්ධ වර්තමාන අගය 132

(3)

නිර්දේශය : ශුද්ධ වර්තමාන අගය ධන අගයක් ගන්නා බැවින් මෙම ව්‍යාපෘතිය පිළිගත හැකි ය.

විකුණුම් ජ´නලය (රු. ´000)

දිනය	විස්තරය	වටිනාකම	VAT	එකතුව
	විමල් ට්‍රේඩර්ස්	100	18	118
	කමල් ට්‍රේඩර්ස්	200	36	236
	එකතුව	**300**	**54**	**354**

ගැනුම් ජ´නලය (රු. ´000)

දිනය	විස්තරය	වටිනාකම	VAT	එකතුව
	පෙරේරා ට්‍රේඩර්ස්	50	09	59
	ලිවේරා ට්‍රේඩර්ස්	150	27	177
	සිල්වා ට්‍රේඩර්ස්	250	45	295
	එකතුව	**450**	**81**	**531**

මුදල් ලැබීම් ජ´නලය (රු. ´000)

දිනය	විස්තරය	වට්ටම්	වටිනාකම	විශ්ලේෂණ		
				විකුණුම්	ණයගැති	VAT
	විමල් ට්‍රේඩර්ස්	10	150	-	150	-
	නිමල් ට්‍රේඩර්ස්	5	45	-	45	-
	කමල් ට්‍රේඩර්ස්	-	200	-	200	-
	අත්පිට විකුණුම්	-	1416	1200	-	216
	එකතුව	**15**	**1811**	**1200**	**395**	**216**

මුදල් ගෙවීම් ජ´නලය (රු. ´000)

දිනය	විස්තරය	වට්ටම්	වටිනාකම		විශ්ලේෂණ			
				ගැනුම්	ණයහිමි	වියදම	වෙනත්	VAT
	පෙරේරා ට්‍රේඩර්ස්		60	-	60	-	-	-
	ලිවේරා ට්‍රේඩර්ස්	20	120	-	120	-	-	-
	සිල්වා ට්‍රේඩර්ස්	10	200	-	200	-	-	-
	අත්පිට ගැනුම්	-	590	500	-	-	-	90
	යන්ත්‍ර ගැනුම්	-	236	-	-	-	200	36
	වෙනත් වියදම්	-	59	-	-	50	-	9
	එකතුව	**30**	**1265**	**500**	**380**	**50**	**200**	**135**

මුදල් ගිණුම (රු.'000)

ඉ/ගේ ශේෂය	75	ණයහිමි පාලන	380
ණයගැති පාලන	395	ගැනුම්	500
විකුණුම්	1200	වෙනත් වියදම්	50
VAT පාලන	216	වෙනත්	200
		VAT පාලන	135
		ප/ගේ ශේෂය	621
	1886		1886

ණයගැති පාලන ගිණුම (රු.'000)

ඉ/ගේ ශේෂය	350	මුදල්	395
විකුණුම්	300	දුන් වට්ටම්	15
VAT	54	ප/ගේ ශේෂය	294
	704		704

ණයහිමි පාලන ගිණුම (රු.'000)

මුදල්	380	ඉ/ගේ ශේෂය	750
ලද වට්ටම්	30	ගැනුම්.	450
		VAT	81
ප/ගේ ශේෂය	871		
	1281		1281

VAT පාලන ගිණුම (රු.'000)

මුදල්	135	ඉ/ගේ ශේෂය	45
ණයහිමි පාලන	81	මුදල්	216
		ණයගැති පාලන	54
ප/ගේ ශේෂය	99		
	315		315

ප්‍රශ්න අංක 05 පිළිතුරු

අ.(1)

අමායා,නිලූ සහ විශ්මි හවුල් ව්‍යාපාරය

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය (රු.000)

විකුණුම්			10 500
විකුණුම් පිරිවැය			(5 930) (පෙරවැඩ 01) (02)
දළ ලාභය			4 570
වෙනත් ආදායම් - ගොඩනැගිලි කුලී			80 (01)
මෙහෙයුම් වියදම්			2 190 (පෙරවැඩ 02) (02)
ණය පොලී			60 (පෙරවැඩ 03) (02)
කාලච්ඡේදයේ ලාභය			2 400
ප්‍රාග්ධන පොලී - අමායා		480 (01)	
නිලූ		420 (01)	(900)
වේතන - විශ්මි			(600) (01)
ලාභ කොටස් - අමායා		360	
නිලූ	(02)	360	
විශ්මි		180	(900)

පෙරවැඩ 01 (රු.000)

විකුණුම් පිරිවැය	6 200
සුපරීක්ෂක වේතන	(300) (01)
තොගයේ 1/10	30 (01)
	5 930

පෙරවැඩ 02 (රු.000)

මෙහෙයුම් වියදම්	2 010
විකුණුම් සේවක වැටුප්	100 (01)
ගොඩනැගිලි කුලී	80 (01)
	2 190

පෙරවැඩ 03 (රු.000)

ණය පොලී

බැංකු ණය පොලී	40 (01)
නිලූ ගේ ණය පොලී	20 (01)
	60

(2)

ප්‍රාග්ධන ගිණුම් (රු.000)

	අමායා	නිලූ	විශ්මි		අමායා	නිලූ	විශ්මි
කීර්තිනාමය	720	720 01	360	ශේෂය ඉ/ගේ	8 000	7 000	
				මුදල්			5 000 01
				අමුද්‍රව්‍ය ගැනුම් ගිණුම			1 000 01
				කීර්තිනාමය	900	900 01	
ශේෂය ප/ගේ	8 180	7 680	5 640	නිලූගේ ණය ගිණුම		500 01	
	8 900	8 400	6 000		8 900	8 400	6 000

ජංගම ගිණුම (රු.000)

	අමායා	නිලූ	විශ්මි		අමායා	නිලූ	විශ්මි
ශේෂය ඉ/ගේ	300			ශේෂය ඉ/ගේ		900	
ගෙවූ වේතන			300 01	ප්‍රාග්ධන පොලී	480	420 01	
මුදල් ගැනිලි	120	120 01		වේතන			600 01
ගොඩනැගිලි කුලී			80 01	ලාභ කොටස්	360	360 01	180
ශේෂය ප/ගේ	520	1 580	400	ණය පොලී		20 01	
				විකුණුම් සේවක වැටුප්	100 01		
	940	1 700	780		940	1 700	780

(ආ)

(1) 2000 – 200 = රු. 1 800 02
    01 01

(2) මුළු ස්ථාවර පිරිවැය

බෝට්ටු ගාස්තු	38 000 x 4	=	152 000	01
ඉන්ධන	17 000 x 4	=	68 000	02
ප්‍රචාරණ		=	10 000	
ජීවිතාරක්ෂක කබා		=	4 000	01
			234 000	

(3) $\dfrac{\text{ස්ථාවර පිරිවැය}}{\text{ඒකක දායකය}}$ $\dfrac{234\ 000}{1\ 800} = 130$ (02)

(4) $\dfrac{\text{ස්ථාවර පිරිවැය + අතිරික්තය}}{\text{ඒකක දායකය}}$ $\dfrac{234\ 000\ (01) + 90\ 000\ (01)}{(01)\ 1\ 800} = 180$ 180 – 130 = 50 (01) (04)

විකල්ප	$\dfrac{\text{අතිරික්තය}}{\text{ඒකක දායකය}}$	$\dfrac{90\ 000}{1\ 800}$	= 50

$\dfrac{\text{ස්ථාවර පිරිවැය + අතිරේක ප්‍රචාරණ වියදම + අතිරික්තය}}{(x - 200)} = 200$

(01) $\dfrac{234\ 000 + 10\ 000\ (01) + 180\ 000\ (01)}{\text{විකුණුම් මිල} - 200\ (01)} = 200$ (01)

විකුණුම් මිල = රු. 2 320.00

ප්‍රශ්න අංක 06 පිළිතුරු

(අ)

සීමිත උදාර පොදු සමාගම

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ			
ගනුදෙනුකරුවන්ගෙන් ලද මුදල්	25 050		← පෙර වැඩ 01
සැපයුම්කරුවන්ට සහ සේවකයන්ට ගෙවූ මුදල්	(22 735)		← පෙර වැඩ 02
	2 315		
ගෙවූ පොළී	(500)		← පෙරවැඩ 03
ගෙවූ ආදායම් බදු	(1 860)		
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල්		(45)	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ			
ලී බඩු හා උපකරණ මිලට ගැනීම්	(7 500)		← පෙරවැඩ 04
උපකරණ විකිණීමෙන් ලද මුදල්	7 950		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල්		450	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ			
කොටස් නිකුත් කිරීම	6 000		
ලාභාංශ ගෙවීම	(2 500)		← පෙරවැඩ 05
ණය මුදල් ගෙවීම	(2 000)		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල්		1500	
කාලච්ඡේදය සඳහා ශුද්ධ මුදල් වැඩිවීම		1905	
2024.04.01 දිනට මුදල් හා මුදල් සමාන දෑ		520	
2025.03.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ		2 425	

පෙරවැඩ 01

වෙළෙඳ ලැබිය යුතු දෑ	(රු. 000)
2024.04.01 ශේෂය	1 220
විකුණුම්	6 500
දුන් වට්ටම්	(290)
2025.03.31	(1 880)
ලද මුදල්	5 550
අත්පිට විකුණුම්	19 500
	25 050

පෙරවැඩ 02

වෙළෙඳ ගෙවිය යුතු දෑ		(රු.000)
2024.04.01 ශේෂය		1 080
ගැනුම්		7 800
ලද වට්ටම්		(330)
2025.03.31 ශේෂය		(1 975)
ගෙවූ මුදල්		6 575
අත්පිට ගැනුම්		11 700
වියදම් ගෙවීම		
2024.04.01 උපචිත	960	
වර්ෂයට අදාළ වියදම් (ක්ෂය හැර)	5 100	
2025.03.31 උපචිත	(1 600)	
	4 460	4 460
		22 735

පෙරවැඩ 03

ආදායම් බදු	(රු.000)
2024.04.01 ශේෂය	740
ආදායම් බදු වියදම	1 950
2025.03.31 ශේෂය	(830)
ගෙවූ මුදල්	1 860

පෙරවැඩ 04

දේපළ පිරියත හා උපකරණ	(රු.000)
2024.04.01 දිනට ධාරණ අගය	18 300
මිලට ගැනීම්	7 500
ප්‍රත්‍යාගණනය	8 000
ක්ෂය	(3 400)
2025.03.31	(22 500)
විකුණූ වත්කමේ ධාරණ අගය	7 900
ලාභය	50
උපකරණ විකිණීමෙන් ලද මුදල	7 950

පෙරවැඩ 05

<u>රඳවාගත් ඉපැයුම්</u>	(රු.000)
2024.04.01 ශේෂය	2 100
කාලච්ඡේදයේ ලාභය (12 600 - 8 000)	4 600
සංචිත ප්‍රාග්ධනීත කිරීම	(4 000)
2025.03.31 ශේෂය	(200)
ලාභාංශ ගෙවීම්	2 500

ආ

(1)
- (i) රු. 6 000 000
- (ii) රු. 2 000 000
- (iii) රු. 1 900 000
- (iv) රු. 7 995 000
- (v) රු. 18 000 000

(i) $\frac{\text{ශුද්ධ ලාභය}}{30\ 000} \times 100 = 20$

$= 6\ 000$

(ii) $\frac{\text{බදු පෙර ලාභය} + 7\ 000}{7\ 000} = 8\ 000$

$8\ 000 - 6\ 000 = 2\ 000$

(iii) $\frac{24\ 000}{\text{සාමාන්‍ය ණයගැති}} = 12 = 4\ 000$

$4\ 000 - 2\ 100 = 1\ 900$

(iv) $4\ 100 \times 1.95 = 7\ 995$

(v) $\frac{7\ 000}{\text{හිමිකම්} + 7\ 000} \times 100 = 28$

18 000

(2)
- (i) අසාර්ථකයි
- (ii) සාර්ථකයි
- (iii) සාර්ථකයි
- (iv) සාර්ථකයි
- (v) අසාර්ථකයි

ඉ.

කම්කරු සුබසාධක සංගමය

<u>මුදල් ගිණුම</u> (රු.000)

ශේෂය ඉ/ගේ		308	ආපනශාලා උපකරණ	210	02 පෙරවැඩ 01
ආපනශාලා විකුණුම්	03	1 820	ආපනශාලා ණය හිමියෝ	888	02 පෙරවැඩ 02
සාමාජික මුදල්		690	විදුලි ගාස්තු (130 + 30)	160	01
			ආපනශාලා වැටුප්	600	01
			ආපනශාලා වෙනත් වියදම්	50	01
			මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	120	01
			සංගමයේ වෙනත් වියදම්	40	01
			ශේෂය ප/ගේ	750	
		2 818		2 818	

පෙරවැඩ 01

දේපළ පිරියත හා උපකරණ	(රු.000)	
2025.03.31 ශේෂය	5 220	
ක්ෂය (80 + 210)	290	01
2024.04.01 ශේෂය	(1 800)	02
මෝටර් රථ පරිත්‍යාග	(3 500)	01
මිලට ගත් ආපනශාලා උපකරණ	210	

පෙරවැඩ 02

	(රු.000)	
විකුණුම් පිරිවැය	900	
2025.03.31 තොගය	80	
2024.04.01 තොගය	(160)	
ගැනුම්	820	01
2024.04.01 ණයහිමි	160	01
2025.03.31 ණය හිමි	(92)	
ණයහිමියන්ට ගෙවීම	888	

පෙරවැඩ 03

සාමාජික මුදල් ගිණුම

ශේෂය ඉ/ගේ	22	ශේෂය ඉ/ගේ	05
ආදායම් වියදම් ගිණුම	700	මුදල්	690
		කපා හැරීම්	15
ශේෂය ප/ග	15	ශේෂය ප/ගේ	27
	737		737